# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1422— 2005 දෙසැම්බර් 02 වැනි සිකුරාදා — 2005.12.02

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (IIඅ) වැනි ජේදය - පළකිරීම්

## විභාග, විභාග ප්‍රතිඵල ආදිය

### ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය මෙහෙයවන 2006 වර්ෂය සඳහා ඔෆ්සෙට් මුද්‍රණ ශිල්පය පිළිබඳ පාඨමාලා

ශ්‍රී ලංකාවේ මුද්‍රණ ක්ෂේත්‍රයට අදාල පාඨමාලා හඳුන්වාදීමේ අද්විතීය ස්ථානයක් ලබා සිටින තොරතුරු හා මාධ්‍ය අමාත්‍යාංශය යටතේ පැවැත්වෙන ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය මගින් 2006 වර්ෂය සඳහා ඕෆ්සෙට් මුද්‍රණ ක්ෂේත්‍රයට (Offset Printing) අදාල පහත සඳහන් පාඨමාලා හඳුන්වා දෙයි.

2006 ජනවාරි මාසයේදී ආරම්භ කිරීමට නියමිත මෙම පාඨමාලාවලට අයදුම්පත් කැඳවීම දැන් ආරම්භ කර ඇත. මෙම පාඨමාලා වලට ඇතුල් කිරීම සීමා කෙරෙන අතර තෝරා ගැනීම සම්මුඛ පරීක්ෂණයකින් අනතුරුව සිදු කෙරේ.

01. ඕෆ්සෙට් පත් ලිතෝ යන්ත්‍ර ක්‍රියාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව :
(Certificate Course in Sheet Fed Litho Press Operations)

මෙම පාඨමාලාව තුලින් පත් ලිතෝ යන්ත්‍ර ක්‍රියාකරණය පිළිබඳ (Sheet Fed Press Operations) පුළුල් අවබෝධයක් හා මනා ප්‍රායෝගික පුහුණුවක් ලබා දේ.

මාස 08 ක පමණ කාලයක් පුරා සිංහල මාධ්‍යයෙන් පැවැත්වෙන මෙම අර්ධ කාලීන පාඨමාලාව න්‍යායාත්මක හා ප්‍රායෝගික පංති වලින් සමන්විත වේ.

මෙම පාඨමාලාව ක්ෂේත්‍රයේ නියැලි පුද්ගලයින්ට මෙන්ම මුද්‍රණ ක්ෂේත්‍රයට ඇතුලත් වීමේ උනන්දුවක් දක්වන නවකයන්ට ද සුදුසු වන අයුරින් පාඨමාලා අන්තර්ගතය සම්පාදනය කොට ඇත.

පාඨමාලා අන්තර්ගතය :
* Basic Principles of Offset Lithography
* Introduction to Pre-press
* Plates and Blankets
* Damping and Inking Systems
* Paper and Ink requirements
* Cylinder Paking and Pressure Control
* Press register system and control
* Press Tubleshooting
* Improvement of quality in sheet fed Colour Printing
* New Technological Developments in the Printing Industry

02. ඕෆ්සෙට් ලිතෝකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව :
(Certificate Course in Offset Lithography)

මෙම පාඨමාලාව තුළින් ඔෆ්සෙට් ලිතෝකරණය පිළිබඳ පුළුල් දැනුමක් සහ අවබෝධයක් ලබාදෙන අතර මුද්‍රණ ආයතනයක ඵලදායීතාව හා තත්ත්වයෙන් උසස් නිෂ්පාදන ලබාගන්නා අයුරු මැනවින් පැහැදිලි කෙරේ.

සිංහල සහ ඉංග්‍රීසි භාෂා මාධ්‍ය වලින් පැවැත්වෙන මෙම අර්ධ කාලීන පාඨමාලාව වසරකට ආසන්න කාලයක් පැවැත්වෙන අතර ප්‍රායෝගික හා න්‍යායාත්මක පංති වලින් සමන්විතව පැවැත්වේ.

පාඨමාලා අන්තර්ගතය :
* Principles of Offset Lithography
* Understanding, Conventional and Digital pre-pres operations
* Colour Theory
* Super - Imposition
* Layout Operations
* Film Assembly
* Offset Plate Making
* Offset Press Operations
* Paper and ink Technology
* Offeset press Configuration
* New Technological Development in the Printing Industry

මේ පිළිබඳ උනන්දුවක් දක්වන අයදුම්කරුවන් කොළඹ, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ පිහිටි ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය, නො.118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, බොරැල්ල යන ලිපිනයෙන් හෝ දුරකථන අංක 2686162, 2679791 අමතා කථා කිරීමෙන් ද විස්තර ලබා ගත හැක.

12-34

---

### නිපුණතා සංවර්ධන, වෘත්තීය හා කාර්මික අධ්‍යාපන අමාත්‍යාංශය

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය

**ප්‍රාදේශීය ආධුනිකත්ව පුහුණු මධ්‍යස්ථානය – ගල්ගමුව**

***2006 වසර සඳහා ආධුනිකයින් බඳවා ගැනීම***

ගල්ගමුව, මොරගොල්ලාගම පාරේ පිහිටුවා ඇති ප්‍රාදේශීය ආධුනිකත්ව පුහුණු මධ්‍යස්ථානය සඳහා 2006 වසර සඳහා ආධුනිකයින් බඳවා ගැනීම පිණිස පාසැල් හැර ගිය තරුණ, තරුණියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

තෝරාගනු ලබන අයදුම්කරුවන්ට මෙම ආයතනයේ දී න්‍යායික සහ ප්‍රායෝගික පුහුණුවක් ද පිළිගත් කාර්මාන්තශාලා හා වාණිජ ආයතනයන්හි ප්‍රායෝගික පුහුණුවක් ද ලබාදෙන අතර පුහුණුව අවසානයේ දී ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය මගින් වෘත්තීය පරීක්ෂණයක් පවත්වා වෘත්තීය සහතික පත් පිරිනමනු ලැබේ.

1.0 පවත්වනු ලබන පූර්ණ කාලීන පාඨමාලා සහ ඒ සඳහා අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් :

| වෘත්තිය | බඳවා ගන්නා ප්‍රමාණය | පුහුණු කාලය | | වයස් සීමාව | සුදුසුකම් |
|---|---|---|---|---|---|
| | | ආයතනික | කාර්යස්ථ | | |
| 1.1 චාප හා වායු පෑස්සුම් | 16 | මාස 09 | මාස 09 | අවු 16-25 | අට වසර සමත් |
| 1.2 පෙදරේරු | 16 | මාස 09 | මාස 09 | අවු 16-25 | අට වසර සමත් |
| 1.3 රූපවාහිනී හා විද්‍යුත් උපකරණ අලුත්වැඩියා ශිල්පී | 16 | මාස 09 | මාස 09 | අවු 16-25 | විද්‍යාව,ගණිතය ඇතුළුව සා. පෙළ සමත් |
| 1.4 වඩු වැඩ ශිල්පී | 16 | මාස 09 | මාස 09 | අවු 16-25 | අට වසර සමත් |
| 1.5 ගෘහස්ථ විදුලි ශිල්පී | 16 | මාස 09 | මාස 09 | අවු 16-25 | අට වසර සමත් |
| 1.6 යතුරු පැදි අලුත්වැඩියා ශිල්පී | 16 | මාස 09 | මාස 09 | අවු 16-25 | අට වසර සමත් |
| 1.7 විදුලි මෝටර් අලුත්වැඩියා ශිල්පී | 16 | මාස 09 | මාස 09 | අවු 16-25 | අට වසර සමත් |

2.0 දීමනා හා වෙනත් ප්‍රතිලාභ :

2.1 පුහුණු වන කාලසීමාව තුළදී මාසික ආධුනිකත්ව දීමනාව ගෙවනු ලැබේ.

2.2 පුහුණුවට බඳවා ගන්නා සියළුම ආධුනිකයින්ට ඉංග්‍රීසි භාෂාව හා පරිගණක දැනුම ලබාදෙනු ලැබේ.

2.3 පුහුණුව අවසන් කර අවසන් වෘත්තීය පරීක්ෂණයෙන් සමත් (ප්‍රවීණතා සහතිකපත් ලාභීන්ට) ආධුනිකයන්ට ස්වයංරැකියා ආරම්භ කිරීම සඳහා නිපුණතා ණය ලබාගැනීමට පහසුකම් සළසා ඇත.

3.0 අයදුම්පත් එවිය යුතු පිළිවෙල :

3.1 සම්පූර්ණ නම, ලිපිනය, උපන් දිනය, ජාතික හැඳුනුම්පත් අංකය. අධ්‍යාපන සුදුසුකම් (සමත් විෂයයන් සහිතව අයදුම් කරනු ලබන වෘත්තීය සඳහන් කළ 11 1/2" x 8 1/4" ප්‍රමාණයේ කඩදාසියක පිළියෙළ කර අයදුම්පත්‍රය බහා එවන ලිපි කවරයේ උඩ වම් කෙළවරේ "ආධුනිකයින් බඳවා ගැනීම -2006" යනුවෙන් සඳහන් කර 2005 දෙසැම්බර් 19 දිනට හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට යොමු කළ යුතුය.

පළාත් අධ්‍යක්ෂ (වයඹ),
ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය.

වයඹ පළාත් කාර්යාලය,
මීගමු පාර, මල්කඩුවාව, කුරුණෑගල.
දුරකථන අංක : 037-2223789/037-2221865.

12-33

---

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (IIආ) වැනි ජේදය - පළකිරීම්

## ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

### මහජන බැංකුව

දංඕවිටින් අගනා ඉඩමක්

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ, හාපිටිගම් කෝරලයේ, උඩුගහ පත්තුවේ, දංඕවිට, මඩබාවිට පිහිටි බෝගහවත්ත *හෙවත්* පැලවත්ත පර්චස් 19.9181 විශාල ඉඩම විකිණීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබේ :

01. ටෙන්ඩර් පත්‍රිකා 2005.12.09 දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ. ව. 9.00 සිට ප. ව. 2.00 දක්වා ආපසු නොගෙවන රු. 50 ක ගාස්තුවක් ගෙවා මහජන බැංකුව, වරකාපොල ශාඛාවෙන් ලබාගත හැකිය. ;

02. රු. 5,000 ක ආපසු ගෙවන මුදලක් මහජන බැංකුව, වරකාපොල ශාඛාවේ තැන්පත් කර එම ලදුපතේ ඡායා පිටපතක් ටෙන්ඩර් පතකට අමුණා එවිය යුතු අතර, මෙම දේපල විකුණා අවසන් කිරීමෙන් පසු එම තැන්පත් මුදල් ආපසු ගෙවනු ඇත. ටෙන්ඩරය ලබාගත් අය තම ටෙන්ඩරයේ සඳහන් මුදල මාසයක කාල සීමාව තුළ ගෙවීමට අපොහොසත් වුවහොත් තැන්පත් මුදල වන රු. 5,000 ආපසු ගෙවනු නොලැබේ. ;

03. නිසි පරිදි සම්පූර්ණකර අත්සන් තබන ලද ටෙන්ඩර්පත්‍ර මුද්‍රා තබන ලද කවරයක බහා කවරයේ වම්පස ඉහළ කෙළවරේ "මිළ ගණන් දංඕවිට පිහිටි දේපල" යනුවෙන් සඳහන් කර 2005.12.09 දින ප. ව. 2.30 හෝ ඊට පෙර අප වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ප්‍රාදේශීය කළමනාකරු, මහජන බැංකුව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, කෑගල්ල යන ලිපිනයට එවිය හැකි අතර, 2005.12.09 දින ප. ව. 2.30 දක්වා එම ලිපිනයේ පිහිටි මහජන බැංකුව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ද බහාලිය හැකිය.;

04. 2005.12.09 දින ප. ව. 3.00 ට ටෙන්ඩර්පත් විවෘත කරන අතර, මෙම අවස්ථාවට ටෙන්ඩර්කරුවනට/නියෝජිතයනට සහභාගි විය හැකිය. ;

05. කිසියම් ටෙන්ඩර්පතක්/කොටසක් හෝ සියලුම ටෙන්ඩර්පත් භාරගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ අයිතිය කෑගල්ල මහජන බැංකුවේ ප්‍රාදේශීය කළමනාකාර මහතා සතු වේ. ;

06. හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීමට අවශ්‍ය ලේඛණ සහ අවශ්‍ය අනිකුත් විස්තර කෑගල්ල මහජන බැංකුව, ප්‍රාදේශීය කළමනාකරුගෙන් ලබාගත හැකිය. ;

07. ටෙන්ඩර් ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමට පෙර ටෙන්ඩර් ඉල්ලුම්කරුවන් විසින් දේපලවල හිමිකම පිළිබඳ සම්පූර්ණයෙන් සෑහීමට පත්විය යුතුය.

වැඩි විස්තර සඳහා ප්‍රාදේශීය කළමනාකරු, මහජන බැංකුව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, අංක14, වින්ස්ටන් වික්‍රමසිංහ මාවත, කෑගල්ල.

දුරකථන අංක : 035-2222300
035-2222396
ෆැක්ස් අංකය : 035-2230500

12-45

---

### මහජන බැංකුව

ගෝනගල්දෙනියෙන් අගනා ඉඩමක්

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, දෙහිගම්පල් කෝරළේ, එගොඩපත පත්තුවේ වහරක පිහිටි නෝත් සනික්‍රොෆ්ට් එස්ටේට් (කොටසක්) නමැති අක්. 01, රූඩ් 01, පර්. 20ක් විශාල ඉඩම විකිණීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබේ. ;

01. ටෙන්ඩර් පත්‍රිකා 2005.12.09 දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ. ව. 9.00 සිට ප. ව. 2.00 දක්වා ආපසු නොගෙවන රු. 50 ක ගාස්තුවක් ගෙවා මහජන බැංකුව, ගෝනගල්දෙනිය ශාඛාවෙන් ලබාගත හැකිය. ;

02. රු. 5,000 ක ආපසු ගෙවන මුදලක් මහජන බැංකුව, ගෝනගල්දෙනිය ශාඛාවේ තැන්පත් කර එම ලදුපතේ ඡායා පිටපතක් ටෙන්ඩර් පතකට අමුණා එවිය යුතු අතර, මෙම දේපල විකුණා අවසන් කිරීමෙන් පසු එම තැන්පත් මුදල් ආපසු ගෙවනු ඇත. ටෙන්ඩරය ලබාගත් අය තම ටෙන්ඩරයේ සඳහන් මුදල මාසයක කාල සීමාව තුළ ගෙවීමට අපොහොසත් වුවහොත් තැන්පත් මුදල වන රු. 5,000 ආපසු ගෙවනු නොලැබේ. ;

03. නිසි පරිදි සම්පූර්ණකර අත්සන් තබන ලද ටෙන්ඩර්පත්‍ර මුද්‍රා තබන ලද කවරයක බහා කවරයේ වම්පස ඉහළ කෙළවරේ "මිළ ගණන් නෝත් සනික්‍රොf්ට්

---

### සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

## වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2005 දෙසැම්බර් මස 09 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2005 නොවැම්බර් මස 25 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

2005 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

**ලක්ෂමන් ගුණවර්ධන**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

රජයේ මුද්‍රණාලයාධිපති විසින් ප්‍රකාශ කරන ලදී.

එස්ටේට් (කොටසක්)" යනුවෙන් සඳහන් කර 2005.12.09 දින ප. ව. 2.30 ට හෝ ඊට පෙර අප වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ප්‍රාදේශීය කළමනාකරු, මහජන බැංකුව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, කෑගල්ල යන ලිපිනයට එවිය හැකි අතර, 2005.12.09 දින ප. ව. 2.30 දක්වා එම ලිපිනයේ පිහිටි මහජන බැංකුව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ද බහාලිය හැකිය. ;

04. 2005.12.09 දින ප. ව. 3.00 ට ටෙන්ඩර්පත් විවෘත කරන අතර, මෙම අවස්ථාවට ටෙන්ඩර්කරුවනට/නියෝජිතයනට සහභාගි විය හැකිය. ;

05. කිසියම් ටෙන්ඩර්පතක්/කොටසක් හෝ සියලුම ටෙන්ඩර්පත් භාරගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ අයිතිය කෑගල්ල මහජන බැංකුවේ ප්‍රාදේශීය කළමනාකාර මහතා සතු වේ. ;

06. හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීමට අවශ්‍ය ලේඛණ සහ අවශ්‍ය අතිකුත් විස්තර කෑගල්ල මහජන බැංකුව, ප්‍රාදේශීය කළමනාකරුගෙන් ලබාගත හැකිය. ;

07. ටෙන්ඩර් ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමට පෙර ටෙන්ඩර් ඉල්ලුම්කරුවන් විසින් දේපලවල හිමිකම පිළිබඳ සම්පූර්ණයෙන් සෑහීමට පත්විය යුතුය. ;

වැඩි විස්තර සඳහා ප්‍රාදේශීය කළමනාකරු, මහජන බැංකුව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, අංක14, වින්ස්ටන් වික්‍රමසිංහ මාවත, කෑගල්ල.

දුරකථන අංක : 035-2222300
035-2222396

ෆැක්ස් අංකය : 035-2230500

12-46

# බඩු බාහිරාදිය විකිණීම්

## මහෙස්ත්‍රාත් අධිකරණය - ගාල්ල

### භාණ්ඩ වෙන්දේසිය

ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු භාණ්ඩ වශයෙන් ඇති රාජසන්තක කරන ලද හා මෙතෙක් හිමිකම් පෑමක් නොකළ පහත සඳහන් භාණ්ඩ 2005.12.10 වැනි සෙනසුරාදා දින පෙ. ව. 9.30 ට අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත සඳහන් කිසියම් භාණ්ඩයක් සඳහා හිමිකම් දක්වන්නෙකු වේනම් වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය අයිතිවාසිකම් ඉදිරිපත් කල යුතුය.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය මත එදින පෙ.ව.9.00 සිට පෙ.ව.9.15 තෙක් භාණ්ඩ පරීක්ෂා කළ හැකිය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවන්හි දී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ පූර්ණ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියේ දී මිළදී ගනු ලබන ද්‍රව්‍යයන් සඳහා එවේලේම මුදල් ගෙවා එකී භාණ්ඩ අධිකරණ භූමියෙන් ඉවත්කර ගත යුතු අතර චෙක්පත් ආදිය භාරගනු නොලැබේ.

06. භාණ්ඩ ගැනුම්කරු ඔහුගේ ජාතික හැඳුනුම්පත රැගෙන ආ යුතුය.

එන්. එස්. හපුආරච්චි,
ප්‍රධාන මහේස්ත්‍රාත්- ගාල්ල.

### වෙන්දේසිය සඳහා ඉදිරිපත් කරනු ලබන භාණ්ඩ

01. වීදුරු බෝතල් විශාල තොගයක්
02. හිරිගල් තොගයක්
03. සවල් විශාල ප්‍රමාණයක්
04. වේවැල් කුඩ තොගයක්
05. යකඩ මුල්ලු තොගයක්
06. රබර් හෝස් මිටි තොගයක්
07. යකඩ පනිට්ටු තොගයක්
08. ප්ලාස්ටික් කෑන් හා බූලි තොගයක්
09. දිරාගිය යකඩ
10. යකඩ කුඩ තොගයක්
11. අබලන් යතුරු ලියන කොටස් කීපයක්
12. අබලන් විදුලි පංකා 02 ක්
13. 160/5 සෝනි වර්ගයේ අඟල් 21 වර්ණ රූපවාහිණී යන්ත්‍ර 01
14. 169/5 අංක 10422564953 සහ එම්. ආර්. ඊ 8125-20 ටයර් 01 යි
15. 42/05 සිංගර් වර්ගයේ දොර දෙකේ ශීතකරණ 01 යි
16. 42/05 අඩි 100 ක් පමණ දිග අඟල් 3/4 රබර් පටි රෝල් 01 යි
17. 161/05 අංක 018820/005114 දරන පිලිප්ස් වර්ගයේ අඟල් 14 රූපවාහිණී 01 යි
18. 165/05 එල්. ජී.වර්ගයේ අංක 100 208 සී.000078 වර්ණ රූපවාහිණී 01 යි
19. 175/05 ඩබ්. අයි. කේ. ඊ. වර්ගයේ ලීටර් 1,000 කලුපාට පියන සහිත වතුර ටැංකි 01 යි
20. 172/5 අංක 5061312 බී/එල් 57 වර්ගයේ ලාකොලපාට ශීතකරණ 01 යි
21. 172/05 ෂෙල් ගෑස් සිලින්ඩර් 03 යි
22. 172/05 ලංකා ලාෆ්ජ් ගෑස් සිලින්ඩර් 01 යි
23. ඒ. ආර්. 678 117-1547 හොණ්ඩා චැලි යතුරු පැදි 01යි
24. ඒ. ආර්. 613 96-5118 හොණ්ඩා ට්‍රේල් යතුරු පැදි 01යි
25. ඒ. ආර්. 2155 84 ශ්‍රී 8572 හොණ්ඩා යතුරු පැදි 01 යි
26. ඒ. ආර්. 02/04 94 ශ්‍රී 0157 හොණ්ඩා සී. ඩී. 90 යතුරු පැදි 01 යි
27. ඒ. ආර්. 3538 ලියාපදිංචි නොකළ හොණ්ඩා සී.50 යතුරු පැදි 01 යි.
28. ඒ. ආර්. 174/05 විශ්කම්භය 05 ප්‍රමාණයේ අඩි 75 කොළපාට රබර් බටයක්
29. ඒ. ආර්. 174/05 විශ්කම්භය 03 ප්‍රමාණයේ කලුපාට රබර් බටයක්
30. ඒ. ආර්. 174/05 විශ්කම්භය 01 ප්‍රමාණයේ කොළපාට රබර් බටයක්
31. ඒ. ආර්. 176/05 අයි. එස්. ඕ. 4706 අංක 0209652 දරන කිලෝග්‍රෑම් 33 නිල්පාට ගෑස් සිලින්ඩරයක්
32. ඒ. ආර්. 176/05 පීඩන පොම්පය සහිත රතුපාට ඔයිල් දැමීමට උපයෝගී කර ගන්නා ලද අඩි 2 1/2 ක පමණ උස ටැංකි එකයි
33. ඒ. ආර්. 173/05 මාස්ටර් කෝල්ඩ් වර්ගයේ ඉතාලියේ නිෂ්පාදිත අධි ශීතකරණයක්
34. ඒ. ආර්. 177/05 ඔසාකායි වර්ගයේ වී. සී. ඩී. 2088 එම්. පී. 3 අළුපාට යන්ත්‍ර එකයි.
35. ඒ. ආර්. 178/05 ඇස අඟල් 2 1/2 ප්‍රමාණයේ රතුපාට මාළු දැල් එකක්
36. ඒ. ආර්. 179/05 සිංගර් වර්ගයේ ශීතකරණ එකයි. දොර කැඩී ඇත.
37. ඒ. ආර්. 180/05 එච්. එම්. එස්. යනුවෙන් ඉංග්‍රීසියෙන් අකුරු කොටා ඇති යමහා එන්. යනුවෙන් දක්වා ඇති යමහා වර්ගයේ බෝට්ටු එන්ජින් එකයි
38. ඒ. ආර්. 187/05 විවිධ ප්‍රමාණයේ විවිධ වර්ගයේ සෙරෙප්පු තොගයක්
39. ඒ. ආර්. 182/05 ටී. සී. එල්. වර්ගයේ මොඩල් අංක 1418 වර්ණ රූපවාහිණී යන්ත්‍රයක්
40. ඒ. ආර්. 185/05 අංකය අපැහැදිලි මොනිටරය
41. අංක 100 1636 දරන සෝනි වර්ගයේ අඟල් 21 රූපාවහිනියක්
42. ඒ. ආර්. 400/05 ඩන්ලොප් වර්ගයේ වට ප්‍රමාණය 205 x 16 එස්. 5100 ටයරය
43. ඒ. ආර්. 400/05 තටු කැඩීගිය සිවිලින් ෆෑන් එකයි
44. ඒ. ආර්. 442/05 ලාෆ්ජ් වර්ගයේ ගෑස් සිලින්ඩර් 10 යි
45. ඒ. ආර්. 441/05 අඟල් 06 ග්‍රයින්ඩර් එකයි
බෙන්ඩ් මාස්ටර් හෝස් පවර් ග්‍රයින්ඩරය
46. ඒ. ආර්. 441/05 සුපර් මාස්ටර් ග්‍රයින්ඩර් එකක්
47. ඒ. ආර්. 444/05 සුදුපාට කොම්ප්‍රෙසරය සහිත දොර දෙකේ ශීතකරණයක්
48. ඒ. ආර්. 444/05 රිම් එක සහිත 225/75 දරන ටයර් එකයි. 39 එච්. 29002 දරන රිම් එක
49. ඒ. ආර්. 647/05 කැරකෙන රෝද සහිත පුටු එකයි
50. ඒ. ආර්. 848/05 සීරියල් අංක 56453 දරන කාර් කැසට් එකයි
51. ඒ. ආර්. 1015/05 රතුපාට කොකා කෝලා ලාංඡනය සහිත ශීතකරණයක්
52. එම අංකය පෙප්සි නම සඳහන් නිල්පාට අබලන් ශීතකරණයක් වර්ගය අංකය අපැහැදිලි ශීතකරණයක්
53. එම අංකය ඕවලොක් මැෂින් හතරක්
54. ඒ. ආර්. 1014/05 රතුපාට පොලිෂ් එකයි
55. ඒ. ආර්. 1016/5 අඩි 02 ක් උස අඩි 1 1/2 ක් පළල හාප් බෝඩ් එම්. ඩී. එෆ්ජ්. හිස් පෙට්ටි 01 යි
56. ඒ. ආර්. 1057/05 නිල්පාට ආරක්ෂක හිස් වැස්මක්
57. ඒ. ආර්. 1067/05 ගෑස් සිලින්ඩර් එකයි. කිලෝ 4.8 ප්‍රමාණයේ
58. ඒ. ආර්. 1407/10 අඩි 02 ක් පළල අඩි 04 ක් දිග පයිබර් වර්ගයේ නිල්පාට වතුර ටැංකිය
59. ඒ. ආර්. 1799/05 පැනසොනික් වර්ගයේ කැසට් රෙකෝඩරය
60. ඒ. ආර්. 1845/05 අඟල් 1 1/2 විශ්කම්භය සහිත අඩි 4 1/2 ක් දිග ඇලුමිනියම් බට 06 ක්, හිස් අරක්කු කේස් 25 යි
61. ඒ. ආර්. 1600/05 අංකය හා වර්ගය අපැහැදිලි පා පැදි එකයි
62. ඒ. ආර්. 643/05 අංකය අපැහැදිල මඩ්ගාඩ් නැති පා පැදි එකයි
63. ඒ. ආර්. 646/05 ඇට්ලස් වර්ගයේ පා පැදි එකයි
64. ඒ. ආර්. 648/05 එල්. කේ. 28424 දරන වර්ගයෙ අපැහැදිලි පා පැදි එකයි
65. ඒ. ආර්. 706/05 ඉදිරි රෝදය ගැලවුන මවුන්ටන් පා පැදිය
66. ඒ. ආර්. 706/05 කේ. 564968 දරන හීරෝ පා පැදිය
67. ඒ. ආර්. 706/05 කුඩා තද නිල් රෝද දෙකේ පා පැදිය
68. ඒ. ආර්. 707/05 ආර්. එම්. අයි. වර්ගයේ නිල් පාට පැදිය
69. ඒ. ආර්. 1017/05 අංකය එස්. ආර්. එස්. 11973 දරන නිල්පාට ස්පෝට්ස් වර්ගයේ පා පැදිය
70. ඒ. ආර්. 1019/05 අංකය හා වර්ගය අපැහැදිලි මවුන්ටන් පා පැදිය
71. ඒ. ආර්. 1019/05 අංකය හා වර්ගය අපැහැදිලි ස්පෝට්ස් පා පැදිය
72. ඒ. ආර්. 797/05 වර්ගය හා අංකය නොමැති පා පැදිය
73. ඒ. ආර්. 866/05 වර්ගය හා අංකය නොමැති පා පැදිය
74. ඒ. ආර්. 867/05 වර්ගය හා අංකය නොමැති පා පැදිය
75. ඒ. ආර්. 873/05 වර්ගය හා අංකය නොමැති පා පැදිය
76. ඒ. ආර්. 889/05 මවුන්ටන් වර්ගයේ පා පැදි එකයි
77. ඒ. ආර්. 888/05 අංකය හා වර්ගය අපැහැදිලි කොළ පාට පා පැදි එකයි
78. ඒ. ආර්. 941/05 හීරෝ වර්ගයේ පා පැදි එකයි
79. ඒ. ආර්. 943/05 අංකය හා වර්ගය අපැහැදිලි පා පැදි එකයි
80. ඒ. ආර්. 942/05 සී. ඩී. 80769 දරන වර්ගය අපහැදිලි පා පැදි එකයි
81. ඒ. ආර්. 1013/05 අංක සී 11447 දරන වර්ගය අපැහැදිලි පා පැදි එකයි
82. ඒ. ආර්. 1011/05 අංක වී. 145821 දරන හීරෝ වර්ගයේ පා පැදි එකයි
83. ඒ. ආර්. 1016/05 අංකය හා වර්ගය අපහැදිලි පා පැදි එකයි
84. ඒ. ආර්. 1018/05 අංකය 19842 දරන වර්ගය නොදන්නා නිකල් පාපැදි එකයි
85. ඒ. ආර්. 1018/05 අංකය අපැහැදිලි නිල් පාට පා පැදි එකයි
86. ඒ. ආර්. 1018/05 අංකය අපැහැදිලි මවුන්ටන් වර්ගයේ පා පැදි එකයි
87. ඒ. ආර්. 1016/05 අංකය අපැහැදිලි මවුන්ටන් වර්ගයේ පා පැදි එකයි
88. ඒ. ආර්. 856/05 අංකය අපැහැදිලි ඊගල් වර්ගයේ පා පැදි එකයි
89. ඒ. ආර්. 856/05 අංකය අපැහැදිලි මවුන්ටන් වර්ගයේ පා පැදි එකයි
90. ඒ. ආර්. 1088/05 අංකය හා වර්ගය අපහැදිලි පා පැදි එකයි
91. ඒ. ආර්. 1127/05 03 සී 3972 දරන පා පැදි එකයි
92. ඒ. ආර්. 1128/05 අංකය අපහැදිලි හන්ටර් වර්ගයේ පා පැදි එකයි
93. ඒ. ආර්. 1227/05 අංකය හා වර්ගය අපැහැදිලි ස්පෝට් පා පැදි එකයි
94. ඒ. ආර්. 1227/05 අංකය හා වර්ගය අපහැදිලි ස්ටැන්ඩඩ් වර්ගයේ පා පැදි එකයි
95. ඒ. ආර්. 1229/05 අංකය හා වර්ගය අපහැදිලි පා පැදි එකයි
96. ඒ. ආර්. 1230/05 මවුන්ටන් වර්ගයේ පා පැදි එකයි
97. ඒ. ආර්. 1230/05 එම්. වී. අයි. 6109 දරන කාන්තා පා පැදි එකයි
98. ඒ. අර්. 1231/05 අංක 81930 දරන වර්ගය අපැහැදිලි පා පැදි එකයි
99. ඒ. ආර්. 14664/05 අංකය හා වර්ගය අපැහැදිලි පා පැදි එකයි
100. ඒ. ආර්. 1467/05 කෙන්ට්‍රා වර්ගයේ මවුන්ටන් පා පැදි එකයි
101. ඒ. ආර්. 1467/05 ස්ටැන්ඩඩ් වර්ගයේ කලු පාට පා පැදි එකයි
102. ඒ. ආර්. 1498/05 අංක 1376606 දරන ලුමාල ස්පෝට්ස් පා පැදි එකයි
103. ඒ. ආර්. 1653/05 අංකය හා වර්ගය අපැහැදිලි පා පැදි එකයි
104. ඒ. ආර්. 645/05 නැව් ගැට ගැසීමට ගන්නා අඩි 28 ක් දිග කඹය

අධිකරණ ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීමේ දී ඉවත් කරන ලද හා දිරාපත්ව ඇති ලී තොගයක්.

12-02

---

## මහෙස්ත්‍රාත් අධිකරණය - මහව

### අධිකරණයට ඉදිරිපත් කරනු ලැබූ භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මහව මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාලව රාජසන්තක කරන ලද මෙතෙක් හිමිකම් නොකියන ලද සහ වෙන්දේසි කිරීමට නියෝග කරන ලද සහ වෙන්දේසි දින දක්වා රාජසන්තක කරන ලද මෙහි පහත සඳහන් ද්‍රව්‍යයන් 2005.12.24 වැනි දින පෙ. ව. 10.00ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත සඳහන් වන කිසියම් ද්‍රව්‍යයක් පිළිබඳව හිමිකම් දන්වන්නෙකු වේනම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු ය.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත ද්‍රව්‍යයන් පරීක්ෂාකර බැලිය හැකිය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගන්නා අවස්ථාවල දී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියේ මිළදී ගන්නා ද්‍රව්‍යයන් සඳහා එම අවස්ථාවේ දීම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. සියළුම ගෙවීම් මුදලින් කළ යුතු අතර චෙක්පත්/මුදල් ඇනවුම් ආදිය භාරගනු නොලැබේ.

06. වෙන්දේසියේ දී භාණ්ඩ මිලදී ගන්නන් විසින් තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම පිණිස ජාතික හැඳුණුම්පත ඉදිරිපත් කළ යුතු ය.

ආර්. එම්. පී. එස්. කේ. රත්නායක,
දිසා විනිසුරු සහ මහෙස්ත්‍රාත්,
මහව.

2005 ඔක්තෝබර් මස 21 වැනි දින,
මහව මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

### 2005 දෙසැම්බර් වෙන්දේසිය

| නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|
| (1) ඒ. ආර්. 420/05 | අංක එල් 214456 දරන පාපැදිය |
| (2) ඒ. ආර්. 247/05 | අංක එච්. ඒ. 91-06077 දරන පාපැදිය |
| (3) ඒ. ආර්. 210/05 | අංක එස්– 557313 එවන් වර්ගයේ පාපැදිය |
| (4) ඒ. ආර්. 209/05 | අංක 689432 සිංගර් වර්ගයේ පාපැදිය |
| (5) ඒ. ආර්. 208/05 | අංක එස්. පී. 93-යූ. 3384 දරන පාපැදිය |
| (6) ඒ. ආර්. 78/05 | අංක එෆ්. 116025 හීරෝ වර්ගයේ පාපැදිය |
| (7) ඒ. ආර්. 79/05 | අංක 12-593751 ලුමාලා පාපැදිය |
| (8) ඒ. ආර්. 48/05 | අංක 55975751 ලුමාලා පාපැදිය |
| (9) ඒ. ආර්. 622/04 | අංක 13 එෆ්. ආර්. 3502 ඊස්ටන් පාපැදිය |
| (10) ඒ. ආර්. 498/04 | අංකය අපැහැදිලි පාපැදිය |
| (11) ඒ. ආර්. 499/04 | අංක පී. පී. 2790 දරන පාපැදිය |
| (12) ඒ. ආර්. 500/04 | අංක 604122 රොමා වර්ගයේ පාපැදිය |
| (13) ඒ. ආර්. 454/04 | (i) අංක එච්.– 48063 හීරෝ පාපැදිය |
| | (ii) අංක 089410 හීරෝ පාපැදිය |
| (14) ඒ. ආර්. 612/05 | අංක සී 3348949 ලුමාලා පාපැදිය |
| (15) ඒ. ආර්. 613/05 | අංක සී. එච්. 1104 දරන පාපැදිය |
| (16) ඒ. ආර්. 262/05 | අංක ජේ-2159256 ලුමාලා පාපැදිය |
| (17) ඒ. ආර්. 263/05 | අංක 7038790 හැමිල්ටන් පාපැදිය |
| (18) ඒ. ආර්. 264/05 | අංක 208910 දරන පාපැදිය |
| — | අබලන් පාපැදි කොටස් අඩංගු සුන්බුන් ගොඩක් |
| ඒ. ආර්. 422/04 | චැසි අංක 372-017526 යමහා වර්ගයේ යතුරු පැදිය |
| 1343 | බන්ඩි කියත් 01 |
| ඒ. ආර්. 606/04 | උදළු 04 |
| ඒ. ආර්. 571/04 | ලි ඉරන කියත් 01 |
| 13898 | සවල් 01 |
| 13894 | සවල් 01 |
| 8570 | සවල් 01 |
| 6808 | සවල් 01 |
| 4341 | සවල් 01 |
| 49433 | සවල් 01 |
| 14631 | සවල් 01 |
| 14630 | සවල් 01 |
| 14592 | සවල් 01 |
| 13995 | උදළු 01 |
| 14629 | උදළු 01 |
| 14628 | උදළු 01 |
| 14590 | උදළු 01 |
| 13656 | කැති 01 |
| 13655 | කැති 01 |
| 13657 | කැති 01 |
| 13666 | කැති 01 |
| 13658 | කැති 01 |
| 13659 | කැති 01 |
| 13660 | කැති 01 |
| 13661 | කැති 01 |
| 13663 | කැති 01 |
| 13664 | කැති 01 |
| 13665 | කැති 01 |
| බී./28/04 | 1. ගැල්වනයිස් බාල්දි 01 |
| | 2. බෑග් 01 |
| 10567 | දැව ඉරුම් පට්ටල් 01 |
| | රවුම් කියත් 01 |
| | අංක ටී. 902174 දරන චීනයේ නිෂ්පාදිත විදුලි මෝටර් 01 |
| 10425 | දැව ඉරුම් පට්ටල් 01, රවුම් කියත් 01 |
| 9126 | දැව ඉරුම් පට්ටල් 01, රවුම් කියත් 01 |
| 12406 | දැව ඉරුම් පට්ටල් 01 රවුම් කියත් 01 |
| 11728 | (i) එම්. ජී. 4420 දරන බහු කාර්ය ලී වැඩ යන්ත්‍රය |
| | (ii) සකස් කරන ලද උළුවහු කඳන් 05 |
| | ජංගම දුරකථනයක් |
| | (i) ලොකු ප්‍රමාණයේ හීන් බූලි තොගයක් |
| | (ii) තඹ දහර ගොඩක් |
| | (iii) හිස් බෝතල් තොගයක්. |

12-08

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## ලංකා බැංකුව

### ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 22 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2004.06.04 දිනැති අංක 1,344 දරන *ගැසට් පත්‍රයේ* හා 2004.05.28 දිනැති දිනමිණ, තිනකරන් හා ඩේලිනිව්ස් යන පුවත්පත්වල පළකරන ලද යෝජනාවකට අනුකූලව එකී ආඥාපනතේ අංක 26 දරන වගන්තිය යටතේ අයකර ගතහැකි මුල් මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලිය ද, ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපල හා පරිශ්‍ර පිහිටි ස්ථානයේ දී ම 2005.12.24 වැනි දින පෙ. ව. 10.30ට අංක 39, විල්ප්‍රඩ් ගුණසේකර මාවත, කොටුව, මාතර හි පදිංචි වෙන්දේසිකාර එම්. එච්. පද්මානන්ද සිරිවර්ධන විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

### උපලේඛනය

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, අම්බලන්තොට හි නැගෙනහිර ගිරුවාපත්තු උතුර කිවුල ග්‍රාම සේවා නිළධාරි කොට්ඨාසයේ කිවුල හි පිහිටි ඉඩම් කැබැල්ල උතුරට: ජේ. එච්. පුංචිසිංඤෝට අයිති ඉඩම ද, නැගෙනහිරට : පටුමග ද, දකුණට: ඩැනී වර්ණසූරියට අයිති ඉඩම ද, බස්නාහිරට: ඇලට වෙන්කළ කොටසද, මායිම්ව අක්කර එකක (අ. 1, රූ. 0, පර්. 0) ප්‍රමාණයෙන් යුක්ත වේ. මෙය හම්බන්තොට ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයෙ හම්/106/ 1539/96 හි ලියාපදිංචි කර ඇත.

එකී ඉඩම් කැබැල්ල බලයලත් මිනින්දෝරු ඊ. එම්. ප්‍රේමසිරි විසින් සාදන ලද 1996 නොවැම්බර් 09 දිනැති අංක 985 දරන මැත මිණුම් පිඹුරේ පහත සඳහන් පරිදි විස්තර කර ඇත. :

එකී කිවුල හි පිහිටි කිවුල කැලේ නමැති ඉඩමේ එකී අංක 985 දරන පිඹුරේ විස්තර කළ ලොට් අංක 1 වශයෙන් සඳහන් ඉඩම් කැබැල්ල උතුරට: ජේ. එච්. පුංචිසිංඤෝ පදිංචි ඉඩම ද, නැගෙනහිරට: පාර සඳහා වෙන් කළ කොටසද, දකුණට: ඩැනී වර්ණසූරිය පදිංචි ඉඩම ද, බස්නාහිරට: ඇල සඳහා වෙන්කළ කොටස ද, මායිම්ව එකී අංක 985 දරන පිඹුර අනුව අක්කර එකක (අ. 1, රූ 0, පර්. 0) බිම ප්‍රමාණය සමඟ එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි සහ සියලු දේ වේ.

ඩී. කේ. එන්. පියසෝම,
ශාඛා කළමනාකරු.

ලංකා බැංකුව,
අම්බලන්තොට.

12-59

### ලංකා බැංකුව

ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල
22 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

ලංකා බැංකු ආඥා පනතේ 19 වැනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2004.11.05 දිනැති අංක 1,366 දරන *ගැසට් පත්‍රයේ* හා 2004.10.25 දිනැති දිනමිණ, ඩේලිනිව්ස් හා තිනකරන් පුවත්පත්වල පළකරන ලද යෝජනාවකට අනුකූලව එකී ආඥාපනතේ අංක 26 දරන වගන්තිය යටතේ අයකර ගතහැකි මුල් මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලිය ද, ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපල හා පරිශ්‍ර පිහිටි ස්ථානයේ දී ම 2005.12.24 වැනි දින ප. ව. 2.30ට අංක 39, විල්ෆ්‍රඩ් ගුණසේකර මාවත, කොටුව, මාතර හි පදිංචි වෙන්දේසිකාර එම්. ඒ. පද්මානන්ද සිරිවර්ධන විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

උපලේඛනය

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, නැගෙනහිර ගිරුවාපත්තුවේ, වඳුරුප්ප හි පිහිටි බංගලාවත්ත සහ කච්චේරිවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එම්. එච්. පත්මානන්ද සිරිවර්ධන විසින් සාදන ලද 1987 පෙබරවාරි 14 දිනැති අංක 180 දරන පිඹුරේ විස්තර කරන ලද ලොට් 1 වශයෙන් සඳහන් බෙදන ලද්දා වූ නිශ්චිත ඉඩම් කැබැල්ල ඊසානට: අම්බලන්තොට සීටීබී ඩිපෝවට අයිති ඉඩම ද, ගිණිකොනට: වඳුරුප්ප සිට අම්බලන්තොට දක්වා මහා මාර්ගය ද, නිරිත දිගට: එම ඉඩමේ කොටසක් ද, වයඹට: වලව ගඟ ද මායිම්ව එකී අංක 180 දරන පිඹුර අනුව රූඩ් තුනක (අ. 0 රූ 3 පර්. 0) බිම් ප්‍රමාණය සමඟ එහි පිහිටි සියළු දේ වේ. මෙය හම්බන්තොට ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 23/259 හි ලියාපදිංචි කර ඇත.

ඩී. කේ. එන්. පියසෝම,
කළමනාකරු.

ලංකා බැංකුව,
අම්බලන්තොට.
12-60

---

### මහජන බැංකුව - වේයන්ගොඩ ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ
29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභා සීමාව තුල විතානමුල්ල හි පදිංචියට සුදුසු පරිසරයක පිහිටි රූඩ් එකක (අ. 0 රූ. 1 පර්. 0) ඉඩම මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2005.12.22 වැනි දින පෙ. ව. 11.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ දේපල පිහිටි ස්ථානයේ දී විකුණනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 2004.02.06 දින ද, ඩේලිනිව්ස්, දිනමිණ සහ තිනකරන් පුවත්පත්වල 2004.09.22 දින ද, පළ කර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.–* වේයන්ගොඩ සිට මිනුවන්ගොඩ මාර්ගයේ නයිවල දක්වා පැමිණ එම හන්දියෙන් දකුණට ඇති දිවුලපිටිය පාරේ. කි. මී. 7ක් පමණ ගියවිට ඉහුරුකඩේ හන්දිය හමුවේ. එතැනින් දකුණට හැරී යන බොරලු මාර්ගයේ මී. 500ක් පමණ ගියවිට දකුණට වැලි පාරක් හමුවේ. එම පාරේ අවසානයේ මෙම දේපල හමුවේ.

*ගෙවීම් ක්‍රමය.–* වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැනුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය. :

1. ගැණුම් මිලෙන් 10%ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිළෙන් 2 1/2%ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක්,
5. විකුණුම් වියදම සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත මුදුන්ගොඩ, බැලුම්මහර, නුවර පාර, අංක 131, මහජන බැංකුව, බටහිර කලාප III කාර්යාලයේ සහකාර සාමාන්‍යාධිකාරී වෙත ගෙවිය යුතුය.

දුරකථන අංක : 033-2222325, 033-2226741
ෆැක්ස් අංකය : 033-2226165.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඩන්ස්ටන් කෙලාට්,
බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස් සහ බ්‍රෝකර්.

අංක 381 1/1, ගාලු පාර,
කොළඹ 4.
දුරකථන අංක : 01-2584874.
01-2591167
01-2500838.

12-38

---

### මහජන බැංකුව - පේරාදෙණිය ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ
29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

**බැබිලෝන් රිසෝට් හොටෙල් සංකීර්ණය**

පේරාදෙණිය නගරයට නුදුරුව මුරුතලාවේ පිහිටි සංචාරක හෝටල් ව්‍යාපාරයට ඉතා සුදුසු බැබිලෝන් රිසෝට් හොටෙල් නමැති හෝටල් සංකීර්ණය සහිත අක්කර 01, පර්. 38.7ක් විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය මත අප විසින් 2005.12.21 වැනි දින පෙ. ව. 11.00ට ප්‍රසිද්ධ වෙන්දේසියේ පිහිටි ස්ථානයේ දී විකුණනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 2003.03.28 දින ද, දිනමිණ, ඩේලිනිව්ස් සහ තිනකරන් යන පුවත්පත්වල 2003.03.15 වැනි දින ද, පළ කර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.–* මහනුවර කොළඹ මහා මාර්ගයේ පොල්ගහමුල හංදියෙන් දකුණට හැරී සැතපුම් තුනක් පමණ ගියවිට හමුවන මුරුතලාව මවුන්ට් ප්‍රැනියන් තේ කම්හල අසලින් වමට හැරී සැතපුම් 1/8ක් පමණ ගියවිට ඉහත හෝටල් සංකීර්ණය පිහිටා ඇත.

*ගෙවීම් ක්‍රමය.–* වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැනුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය. :

1. ගැණුම් මිලෙන් 10%ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිළෙන් 2 1/2%ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක්,
5. විකුණුම් වියදම සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල.

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත මහජන බැංකුව, මහනුවර ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය වෙත ගෙවිය යුතුය.

දුරකථන අංක : 081-2234283
ෆැක්ස් අංකය : 081-2223017

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ෂොක්මන් සහ සමරවික්‍රම,
ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම බලයලත් වෙන්දේසිකරුවෝ
(රාජ්‍ය හා පෞද්ගලික බැංකුකරුවන් වෙනුවෙන්)
සහ උසාවි කොමසාරිස්වරු.

ප්‍රධාන කාර්යාලය :
අංක 24,
ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංක : 081-2224371,
081-2227593
ෆැක්ස් අංකය : 081-2224371.

නාගරික කාර්යාලය :
අංක 55 ඒ,
ධර්මපාල මාවත,
කොළඹ 03
දුරකථන අංකය: 011-2448526
011-2441761
ෆැක්ස් අංකය : 011-2448526.

12-43

---

### ඩී. එෆ්. සී. සී. බැංකුව

1990 අංක 4 දරන බැංකු මගින් ණයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8
වන වගන්තිය යටතේ විකිණීම

**සීසන්ස් ඇපරල් (ප්‍රයිවෙට්) ලිමිටඩ්**

*වටිනා වාණිජමය ඉඩම් කොටස් 3*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ පල්ලෙ පත්තුවේ තලවතුගොඩ පිහිටි බලයලත් මිනින්දෝරු අයි. ඒ. සී. සේනාරත්න විසින් සාදන ලද 1981.10.18 දාතම හා අංක 1021 හා 1022 සහ 1983.03.30 දාතම හා අංක 2017 දරන පිඹුරුවල නිරූපිත ගොඩඹිවිට සහ කොන්ගහවත්ත නමැති ඉඩම්වල ඒකාබද්ධ ඉඩමේ උප බෙදුමක් වන ලොට් 1-6 වශයෙන් ලකුණු කොට දක්වා ඇති ඉඩම් කොටස් හයෙන් බලයලත් මිනින්දෝරු අයි. ඒ. සී. සේනාරත්න විසින් සාදන ලද 1986 දෙසැම්බර් මස 17 දාතම හා අංක 2558 දරන පිඹුරේ ලොට් 1, 2 සහ 3 වශයෙන් ලකුණු කොට දක්වා ඇති අගනා වාණිජමය ඉඩම් කැබලි 3 එහි පිහිටි වගාවන්, ගහකොළ සහ ගොඩනැගිලි සමග ප්‍රමාණයෙන් ලොට් 1 - අක්. 0 රූඩ් 1 පර්. 24.8
ලොට් 2 - අක්. 0 රූඩ් 1 පර්. 02.5
ලොට් 3 - අක්. 0 රූඩ් 0 පර්. 24.2 ඉඩම්

බලයලත් මිනින්දෝරු අයි. ඒ. සී. සේනාරත්න විසින් සාදන ලද 1986 දෙසැම්බර් 17 දාතම හා අංක 2558 දරන පිඹුරේ ලොට් 6 (අඩි 30 පාරට වෙන් කළ කොටස) වශයෙන් ලකුණු කොට දක්වා ඇති බෙදා වෙන් කොට සීමා නිර්නය කළ බිම් කොටස මතින් මාර්ග අයිතිය ද සමග සහ පහත විස්තර කොට ඇති පරිදි අතිශයින් අගනා ඇඟළුම් කර්මාන්ත ශාලා යන්ත්‍රෝපකරණ ද සමග.

***අංක 127 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපල විස්තරය***

| | *ප්‍රමාණය* |
|---|---|
| එස් 30100ඩී 3 බොයිලරය 400/3/50 38002 ඊඑක්ස් මෝටරය සහ පොම්පය සමග | 01 |
| එම්එස්සී ඉලෙක්ට් එස් අයන් | 14 |
| ස්ටිමන් මොඩල් 629 සී - 8බ්ලූ ස්ට්‍රික් 11 ස්ට්‍රේට් නයිෆ් කටිං මැෂින් | 01 |
| මොඩල් එල්එච් - 515, 2 නීඩ්ල්, නීඩ්ල් fපීඩ් ලොක්ස්ටිච් මැෂින් විත් ක්ලච් මෝටර්, ටේබල් ඇන්ඩ් ස්ටෑන්ඩ් | 02 |
| ගසස් මොඩල් එල් 52-01-04, වන් නීඩ්ල් ත්‍රී ත්‍රෙඩ් ඕවර්ඩ්ජර් මැෂින් ස්ටෑන්ඩ්, ටේබල් සහ මෝටරය සහිත | 02 |
| ගසස් මොඩල් එල් 52-01-4, 1-නීඩල්, 3 ත්‍රෙඩ් ඕවර්ලොක් මැෂින් මෝටරය, මේසය සහ ස්ටෑන්ඩ් සහතික | 08 |
| ජපානයේ නිෂ්පාදිත ජුකී මොඩල් එල්බීඑච් -780-1 නීඩ්ල් ලොක් ස්ටිච් බටන් හෝල් මැෂින් | 01 |
| ජපානයේ නිෂ්පාදිත 'කන්සයි ස්පෙෂල්' මොඩල් ඩීඑෆ්බී -1404 පීඑම්ඩී 4 නීඩ්ල්, ඩබල් චේන්ස්ටිච් ඉලාස්ටික් ඉන්සර්ටිං ඇන්ඩ් ඇටෑචිං මැෂින් | 01 |
| ජපානයේ නිෂ්පාදිත ට්‍රෙෂර් මොඩල් බීඑස් 101-1 නීඩල් බ්ලයින්ඩ් ස්ටිච් මැෂින් | 01 |
| එස්ආර්-700 එක්සෙල් 'ටායියෝ' ත්‍රෙඩ් වයින්ඩර් විත් ස්ටෑන්ඩ් | 01 |
| මෝල්ඩ් මොඩල් ඊඑෆ්එන් 860/3 ටූ ස්පීඩ් ඉලෙක්ට්‍රික් බෑන්ඩ් නයිfප් මැෂින් | 01 |
| ජෙනරේටර් - 35.5 කේවීඒ | 01 |

***අංක 535 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපල විස්තරය***

| | *ප්‍රමාණය* |
|---|---|
| ජුකී එම්ඩී 2366 ඊ ට්වින් නීඩල් එස් ත්‍රෙඩ් සේෆ්ටි ස්ටිච් ඕවර්ලොක් මැෂින් - ටේබල්ටොප්, ස්ටෑන්ඩ් ඇන්ඩ් මෝටර් | 01 |
| ජුකී එම් බී 372 සිංගල් නීඩ්ල් බටන් ඇටෑචිං මැෂින් විත් ටේබල් ටොප් ස්ටෑන්ඩ් ඇන්ඩ් මෝටර් | 01 |
| ජුකී එල්කේ -1850 සිංගල් නීඩ්ල් සිලින්ඩර් බෙඩ් බාර් ටීක් මැෂින් කම්ප්ලීට් විත් ටේබල් ටොප්, ස්ටෑන්ඩ් මෝටර් | 01 |
| ජුකී එල්එච් 515/5033 ට්වින් නීඩ්ල්, ලොක් ස්ටිච් මැෂින් විත් ටේබල් ටොප්, ස්ටෑන්ඩ් මෝටර් | 01 |
| කන්සයි ස්පෙෂල් ඩීඑෆ්බී-1404 පීඑම්ඩී 4 නීඩ්ල් 4 කූපර් ඇන්ඩ් ත්‍රෙඩ් ඉලාස්ටික් ඉන්සර්ටිං ඇන්ඩ් ඇටෑචිං මැෂින් විත් ඔටෝමැටික් ඉලාස්ටික් පීඩ් ඩිවයිස් ඇන්ඩ් පෝල්ඩර් අංක 4111 විත් ටේබල් ටොප්, ස්ටෑන්ඩ් මෝටර් | |
| පෙගාස් ආර් 53-05 ට්වින් නීඩ්ල්, 4 ත්‍රෙඩ්, කර්විඩ් නීඩ්ල්, ඕවර් එජර් fෆ්පා ජෙනරල් ප්ලෑන් සීමිං කම්ප්ලිට් විත් ටේබල් ටොප්, ස්ටෑන්ඩ් ඇන්ඩ් මෝටර් | 02 |
| ජුකී ඩීඩීඑල් - 5550 සිංගල් නීඩ්ල් ලොක්ස්ටිච් මැෂින් විත් ටේබල් ටොප්, ස්ටෑන්ඩ්, මෝටර් | 10 |

***අංක 114 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපල විස්තරය***

| | |
|---|---|
| ජපානයේ නිෂ්පාදිත පෙගසස් 3 නීඩ්ල් 6 ත්‍රෙඩ් fෆ්පා ටේප් වයින්ඩිං, කම්ප්ලීට් විත් 400 ඩබ්ලිව් ක්ලච් මෝටර් සහ සිංගප්පූරුවේ නිෂ්පාදිත මේසය සහ ස්ටෑන්ඩ් | සෙට් 04 |
| ජපානයේ නිෂ්පාදිත ජුකී මොඩල් ඩීඩීඑල් 5550 සිංගල් නීඩ්ල් ලොක්ස්ටිච් මැෂින් -කම්ප්ලීට් විත් ස්ටෑන්ඩ්, ටේබල් ඇන්ඩ් මෝටර් | 50 |
| ජපානයේ නිෂ්පාදිත ජුකී මොඩල් එම්බී 372 චේන්ස්ටිච් බටන් ඇටෑචර්, කම්ප්ලීට් විත් ස්ටෑන්ඩ් ටේබල් ඇන්ඩ් මෝටර් | 02 |

ඩීඑෆ්සීසී බැංකුව විසින් මා වෙත පවරන ලද බලය පරිදි ඉහත සඳහන් කළ දේපළ මා විසින් 2005 දෙසැම්බර් මස 12 වැනිදා සඳුදා පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ යථා පරිදි නීති ගත කළ, කොළඹ තම ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යන සමාගමක් වන සීමාසහිත සීසන්ස් ඇපරල් (ප්‍රයිවෙට්) ලිමිටඩ් (මින් මතු "සමාගම" වශයෙන් හැඳින්වෙන) විසින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් වී. මාවලගෙදර විසින් ලියා සහතික කළ 1991 ජූනි 21 දාතම හා අංක 243, දරන උකස් බැඳුම්කරය හා 1990 ජූනි 8 දාතම හා අංක 126 දරන උකස් බැඳුම්කරය හා 1990 ජූනි මස 8 දාතම හා අංක 126 දරන උකස් බැඳුම්කරය සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් වයි. එස්. රාමසුන්දර විසින් ලියා සහතික කළ 1987 ඔක්තෝබර් මස 16 දාතම හා අංක 299 දරන උකස් බැඳුම්කරය සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. එල්. කමලනේසන් විසින් ලියා සහතික කළ 1989 නොවැම්බර් මස 20 දාතම හා අංක 535 දරන උකස් බැඳුම්කරය සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. ගුණරත්න විසින් ලියා සහතික කළ 1991 දෙසැම්බර් මස 10 දාතම හා අංක 113 හා 1991 දෙසැම්බර් මස 10 දාතම හා අංක 114 යන උකස් බැඳුම්කර මතු බැංකුවට අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති බැවිනි)

*ගෙවීමේ ක්‍රමය.–*

1. මිල තීන්දු වූ වහාම ගැණුම් මිලෙන් 10%ක්,
2. ගැනුම් මිලෙන් ඉතිරි 90% ශ්‍රී ලංකා රජය හෝ වෙනත් අධිකාරියක් විසින් පනවන ලද මේ සඳහා අදාළ වන මොන යම් හෝ නිවේදන බදු, තීරුබදු හෝ ගාස්තු හා සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතුය.
3. පළාත් අධිකාරියට ගෙවිය යුතු පළාත් විකුණුම් බද්ද 1% (සියයට එකයි)
4. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාර),
5. රු. 33,256 නොඉක්මවන සම්පූර්ණ ප්‍රචාරක වියදමින් 50%,
6. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 2,500,
7. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තුව රු. 2,500

කොළඹ 3, ගාලු පාරේ, අංක 73/5 හි ඩීඑෆ්සීසී බැංකුවේදී අදාළ ඔප්පු හා ලිපිලේඛන පරීක්ෂා කර බැලිය හැකිය. දුරකථන අංකය : 2440366.

ඩන්ස්ටන් කෙලාට්,
උසාවි කොමසාරිස් සහ බ්‍රෝකර් විශේෂඥ වෙන්දේසිකරු,
තක්සේරුකරු සහ දේපළ නියෝජිත.

අංක 381 1/1, ගාලු පාර, කොළඹ 4.
දුරකථන අංක 2591167, දුරකථන/ෆැක්ස් : 2500838, 2584874,
ක්ෂණික ඇමතුම් : 0722-250422.
12-39

---

### ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 2000000223.

ණයකරුගේ සම්පූර්ණ නම : රත්නමලල බණ්ඩාරලාගේ ලක්ෂ්මී කුමාරි වන්නිනායක.

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2005.01.07 වැනි දින අංක 1375 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2005.04.30 වැනි දින " ලක්බිම", "ද අයිලන්ඩ්" සහ "තිනක්කුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස පහත විස්තර කර තිබෙන දේපළ අංක 28, නව කාර්යාල සංකීර්ණය, කුමාරතුංග මාවත, කුරුණෑගල යන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු වන ඩබ්. එම්. අයි. ගල්ලෑල්ල මයා විසින් 2005.12.23 වැනි දින පෙ. ව. 11.00 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ නවදහස් හාරසිය තිස්පහයි ශත තිස්හතක (රු. 2,09,435.37) මුදලක් වර්ෂ 2003.06.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත බැංකුවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ හැත්තෑ අටදහස් හාරසිය හතලිස් තුනයි ශත අසූනවයක (රු. 178,443.89) මුදල ද, 2003.06.30 වැනි දින දක්වා පොළිය වශයෙන් රුපියල් තිස්දහස් නවසිය අනූඑකයි ශත හතලිස් අටක් (රු. 30,991.48) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දෙලක්ෂ නවදහස් හාරසිය තිස්පහයි ශත තිස්හතක (රු. 2,09,435.37) ද,

(2) එකී රුපියල් එක්ලක්ෂ හැත්තෑ අටදහස් හාරසිය හතලිස් තුනයි ශත අසූනවයක (රු. 178,443.89) මුදල මත අයවිය යුතු වර්ෂයකට 17% බැගින් වන පොළියක් 2003.07.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීම පිණිස.

උපලේඛනය

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, විලච්චිය කෝරළේ, මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභා සීමාවේ දකුණු ඉවුර යාය 01 ග්‍රාමයෙහි පිහිටි ගොඩ ඉඩම නමැති ඉඩමට 2000.05.03 දින ඒ. එම්. බී. රත්නසිරි මානක තැන විසින් මැන සම්පාදිත අංක 647 පිඹුරු ප්‍රකාර ලොට් 2 ට මායිම් උතුරට : මෙම පිඹුරේ ලොට් 01 ද, නැගෙනහිරට : වයි. එම්. නවරත්නගේ ඉඩම ද, දකුණට : ප්‍රාදේශීය සභා පාර ද, බස්නාහිරට : කේ. බී. වන්නිනායකගේ ඉඩම ද යන මායිම් තුළ අක්කර දෙකක් (අ. 2, රූ. 0, පර්. 0) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළු දේද මාර්ග පරවශතාවය ද සමඟ අනුරාධපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල්. ඩී. ඕ. 152/59, 205 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2005 වූ නොවැම්බර් මස 14 වැනි දින කොළඹ දී ය,
ඉහත නම සඳහන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

12-48

---

### ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 200000025.

ණයකරුගේ සම්පූර්ණ නම : කරුණා පතිරන්නැහැලාගේ හේමචන්ද්‍ර.

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2005.02.25 වැනි දින අංක 1382 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2005.04.30 වැනි දින " ලක්බිම", "ද අයිලන්ඩ්" සහ "තිනක්කුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස පහත විස්තර කර තිබෙන දේපළ අංක 28, නව කාර්යාල සංකීර්ණය, කුමාරතුංග මාවත, කුරුණෑගල යන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු වන ඩබ්. එම්. අයි. ගල්ලෑල්ල මයා විසින් 2005.12.23 වැනි දින ප. ව. 02.30සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ පනස්එක් දහස් දෙසීය අනූඅටයි ශත හතලිස් අට (රු. 151,298.48) මුදලක් වර්ෂ 2002.03.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත බැංකුවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් අනූහත් දහස් හයසිය තිස්පහයි ශත දහසයක (රු. 97,635.16) මුදල ද, 2002.03.31 වැනි දින දක්වා පොළිය වශයෙන් රුපියල් පනස්තුන් දහස් හයසිය හැටතුනයි ශත තිස්දෙකක් (රු. 53,663.32) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක් ලක්ෂ පනස්එක් දහස් දෙසීය අනූඅටයි ශත හතලිස් අට (රු. 151,298.48) ද,

(2) එකී රුපියල් අනූහත් දහස් හයසිය තිස්පහයි ශත දහසයක (රු. 97,635.16) මුදල මත අයවිය යුතු වර්ෂයකට 17% බැගින් වන පොළියක් 2002.04.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකරගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීම පිණිස.

උපලේඛනය

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, අනුරාධපුර ලියාපදිංචි කිරීමේ කොට්ඨාශයේ, ග්‍රාමසේවා කොට්ඨාශ 22බී හි කෙන්දල් කෝරළයේ මධ්‍යම නුවර පළාතේ, පරසන්ගස්වැව ගමේ පිහිටි පරසන්ගස්වැව ඉඩම නමැති ඉඩමට 1989.06.14 දින මිනුම්පති විසින් මැන සාදන ලද එෆ්ප්. වී. 145 අනුව ලොට් 44ට මායිම් උතුරට : ලොට් 50 ද, නැගෙනහිරට : ලොට් 25 (පාර) ද, දකුණට : ලොට් 50 ද, බස්නාහිරට : ලොට් 50 යන මායිම් තුළ පිහිටි හෙක්ටයාර් 0.522න් *හෙවත්* අක්කර එකයි, රූඩ් එකයි, පර්චස් හයක (අ. 1, රූ. 1, පර්. 6) වපසරියකින් යුත් ඉඩම අනුරාධපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ස්වර්ණභූමි 58/191 යටතේ ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2005 වූ නොවැම්බර් මස 14 වැනි දින කොළඹ දී ය,

ඉහත නම සඳහන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරි.

12-47

---

**ලංකා බැංකුව**

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

හල්ග්‍රන්ඔය, රාගල, දියනිල්ලපතන හි පදිංචි වන්නි ආරච්චි කංකානම් බාකිගේ ලින්ටන් මයා හා ගොඩල්ල වත්ත ආරච්චිගේ සෞම්‍යවතී මිය

යොමු අංකය : එල්එන්/2000/76.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2005.04.29 දිනැති අංක 1391 දරන *ගැසට් පත්‍රයේ* හා 2005.04.25 දිනැති "දිනමිණ " හා "තිනකරන් " හා "ඩේලිනිව්ස් " යන පුවත්පත්වල පළ කරන ලද යෝජනාවකට අනුකූලව මුල් මුදලේ ශේෂයද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලිය ගාස්තු හා එකී ආඥාපනතේ අංක 26 දරන වගන්තිය යටතේ අයකර ගතහැකි මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපල හා පරිශ්‍රය පිහිටි ස්ථානයේ දී 2005.12.20 වැනි දින පෙ. ව. 11.30 ට මහනුවර, ටොරින්ටන් පාර, අංක 24 හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

උපලේඛනය

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය කොට්ඨාශයේ, ඔයපහළ කෝරළේ, කුඹල්ගමුව ග්‍රාමයේ පිහිටි, කොළඹ බලයලත් මිනින්දෝරු හා මට්ටම්කරු වන එස්. රාසප්පා මයා විසින් සාදන ලද 1991 ජුනි 9 වැනි දිනැති අංක 3067 දරන පිඹුරේ විස්තර කර ඇති. "හීදැද්ද වත්ත", යැයි හඳුන්වනු ලබන, ඉහත කී අංක 3067 දරන පිඹුර අනුව, උතුරට: ඩබ්. ධර්මදාස විසින් හිමිකම් කියනු ලබන ඉඩමද, නැගෙනහිරට: නායවත්ත කඳුර ද, දකුණට: කායවත්ත කඳුර හා වතුමුල්ල පාර ද, බස්නාහිරට: මහනුවර සිට වතුමුල්ල ට යන මහාමාර්ගය ද මායිම් වූ පර්චස් දහ අටයි දශම හයක (අක්. 0 රූ. 0 පර්. 18.6) *හෙවත්* හෙක්ටයාර් 0.0476 ක වපසරියෙන් යුත් බෙදා වෙන් කරන ලද ඉඩම් කට්ටිය හා දේපල, එහි තුළ පිහිටා ඇති ගොඩනැගිල්ල හා අනෙකුත් සෑම සියලු දේ ද වේ. මෙය නුවරඑළිය දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඕ. 130/221 වෙළුම/පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එස්. මුතුකුමාර් මිය,
කළමනාකාරිණී.

ලංකා බැංකුව,
කඳපොල.
12-61

---

**ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව**

ණය අංකය : 1900001326

ණයකරුගේ සම්පූර්ණ නම විජේසේකර වඩුගේ අනුර ජයලත් සඳනායක

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2005.09.02 වන දින අංක 1409 දරන *ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2005.09.23 වන දින "ලක්බිම", "ද අයිලන්ඩ්", "තිනක්කුරල්" පුවත්පත් වල පළකරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස පහත විස්තර කර තිබෙන දේපළ අංක 28, නව කාර්යාල සංකීර්ණය, කුමාරතුංග මාවත, කුරුණෑගල යන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු වන ඩබ්. එම්. අයි. ගල්ලැල්ල මයා විසින් 2005.12.22 වන දින පෙ.ව. 11.00 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් හැත්තෑතුන් දහස් දෙසිය පනස් තුනයි ශත හතරක (රු. 73,253.04) මුදලක් වර්ෂ 2003.10.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත බැංකුවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් පනස් නවදහස් හාරසිය දොළහයි ශත අනූවක (රු. 59,412.90) මුදලද, 2003.10.31 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් දහතුන් දහස් අටසිය හතළිහයි ශත දහහතරක් (රු. 13,840.14) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් හැත්තෑතුන් දහස් දෙසිය පනස් තුනයි ශත හතරක (රු. 73,253.04) ද,

(2) එකී රුපියල් පනස් නවදහස් හාරසිය දොළහයි ශත අනූවක (රු. 59,412.90) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15% බැගින් වන පොලියක් 2003.11.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකර ගැනීම සඳහාද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීම පිණිස

උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැදිහත් පත්තුවේ වල්ගමුපත්තු කෝරළේ කොස්සව ග්‍රාමයේ කොස්සව වත්ත දකුණු කොටස නැමැති ඉඩමට 1997.12.10 දින එස්. වෙලගෙදර මානක තැන විසින් මැන සම්පාදිත අංක 3569 පිඹුර ප්‍රකාර ලොට් 19 ට මායිම්, උතුරට: එම පිඹුරේම ලොට් 22 ද, නැගෙනහිරට: එම පිඹුරේ ම ලොට් 20 ද දකුණට: එම පිඹුරේ ම අඩි 20 ක් පළල පාර සඳහා වෙන් කළ ලොට් 8 ද, බටහිරට: එම පිඹුරේම ලොට් 18 ද යන මායිම් තුළ පිහිටි පර්චස් පහලොවක (අක්. 0, රූඩ්. 0, පර්. 15) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියලු දේ ද මාර්ග පරවශතාවයද සමග කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 1123/243 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2005 වූ නොවැම්බර් මස 14 වන දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරි.

12-49

---

**සෙලාන් බැංකුව - විදේශ මුදල් ඒකකය**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

ගිණුම් අංකය : 9911-089788-001

1990 අංක 04 දරන බැංකුවලින් දෙන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ අංක 4 වැනි වගන්තිය යටතේ සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය ප්‍රකාර සහ සීමාසහිත සෙලාන් බැංකුව විසින් මා වෙත ප්‍රදානය කර ඇති බලය ප්‍රකාරව මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපල සහ ඊට අයත් සියලු දේ වර්ෂ 2005 දෙසැම්බර් මස 22 වැනි දින පෙ. ව. 10.30 ට එම ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

*වැඩි විස්තර සඳහා.–* 2005.07.29 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* සහ 2005.06.08 වැනි දින ඩේලිනිව්ස්, දිනමිණ සහ තිනකරන් පුවත්පත් බලන්න.

*දේපළට පිවිසෙන මාර්ගය.–* කොළඹ සිට කොළඹ මීගමුව පාරේ නාගොඩ හන්දියේ 9 වැනි කි. මී. කණුව අසලින් දකුණට හැරී ලින්ටන් පාරේ මීටර් 100ක් පමණ ගොස් එම වංගුවෙන් වමට හැරී තවත් මීටර් 50ක් පමණ ගොස් නැවතත් වමට හැරී සිල්වා මාවතට පිවිසෙන්න. එම වංගුවේ සිට මීටර් 350ක් පමණ ගියවිට ඇති වංගුවෙන් දකුණට හැරුණු විට සිල්වා මාවතට මුහුණලා පාරේ වම් පසට ඉහත ඉඩම පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.–* වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම් මිලෙන් 10%ක් ද, පලාත් පාලන ගාස්තු වශයෙන් විකුණුම් මිලෙන් 1%, වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක (දෙක හමාරක ප්‍රතිශතය), වෙන්දේසිය සඳහා වැයවූ සම්පූර්ණ වියදමින් 50%ක් ද, ලිපිකරු සහ නිවේදන ගාස්තු වශයෙන් රු. 500ක් ද, විකුණුම් කොන්දේසි සහතික කිරීම සඳහා නොතාරිස් ගාස්තු වශයෙන් රු. 2,000ක් ද, ගැණුම්කරු විසින් ගෙවිය යුතුය. ගැණුම් මිලෙන් ඉතිරි 90% විකුණූ දින සිට දින 30ක් ඇතුළත ප්‍රධාන කළමණාකරු (නීති), සීමාසහිත සෙලාන් බැංකුව, සෙලින්කෝ සෙලාන් ටවර්හි 12, වන මහළ, අංක 90, ගාලු පාර, කොළඹ 3 වෙත ගෙවිය යුතුය.

උපලේඛනය

බස්නාහිර, පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ සහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුළ අළුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, නාගොඩ පිහිටි බලයලත් මිනින්දෝරු සාලිය වික්‍රමසිංහ විසින් සාදන ලද 1997 අගෝස්තු මස 4 දිනැති අංක 4365 දරන සැලැස්මේ පෙන්නුම් කරන ලබන ආනියාකන්ද එස්ටේට් නමැති ඉඩමේ කැබලි අංක බී වශයෙන් ලකුණු කරන කළ බෙදා වෙන් කළ ඉඩම් කොටසට මායිම්, උතුරට: බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් සාදන ලද 1995.04.18 දිනැති අංක 3302 දරන සැලැස්මේ කැබැලි අංක 2 ද, නැගෙනහිරට: බලයලත් මිනින්දෝරු ඒ. ඊ. විජේසූරිය විසින් සාදන ලද අංක 3408 දරන සැලැස්මේ සඳහන් කැබලි අංක 3 හි කොටසක් ද, දකුණට: පාර සහ බස්නාහිරට: කැබලි අංක 4 දරන මායිම් තුළ එකී අංක 4365 දරන සැලැස්ම අනුව රූඩ් තුනයි, පර්චස් විසි නවයයි දශම පහයි බිංදුවක් (අ. 0 රූ. 3, පර්. 29.50) විශාල ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් බී 363/228 හි ලියාපදිංචි කර ඇත.

*හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසීම්.–* ප්‍රධාන කළමණාකාර තුමා (නීති), සීමාසහිත සෙලාන් බැංකුව, සෙලින්කෝ සෙලාන් ටවර්ස්, 12, වැනි මහළ, අංක 90, ගාලු පාර, කොළඹ 3, දුරකථන අංක: 2456284, 2456263.

කේ. පී. එන්. සිල්වා (සා.වි.),
බලයලත් වෙන්දේසිකරු,
තක්සේරුකරු හා උසාවි කොමසාරිස්,

අංක 186, දෙවන මහල,
උසාවිය පාර, කොළඹ 12.
දුරකථන අංක : 5667708, 5367709, ෆැක්ස් අංකය : 5367709.
12-67

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් - මහනුවර ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පදිංචියට සුදුසු මහල් නිවාස ගොඩනැගිල්ලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මහනුවර දිස්ත්‍රික්කයේ, උඩුනුවර ප්‍රාදේශීය සභා සීමාවන් තුළ මාම්පිටිය ගමේ එළුගොඩ මංසන්දියට ඉතා නුදුරුව බෝයගම පාරේ පිහිටි ආරවේගොඩහේන නමැති ඉඩමෙන් බෙදූ කොටසක් හා එහි තුළ පිහිටි සියලු පහසුකම් සහිත සතර මහල් නිවාස ගොඩනැගිල්ල ඇතුළු අනෙකුත් සියලු දේ ඉඩමේ ප්‍රමාණය - පර්චස් 22.7යි.

මෙම දේපළ ලලිත් අතුල නවරත්න යන අය බන්ධනදායී වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔfප් සිලෝන් ලිමිටඩ් වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

2005ක් වූ දෙසැම්බර් මස 28 වැනි දින ප. ව. 2.00ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2005.10.14 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2005.09.30 වැනි දින ද අයිලන්ඩ්, තිනකරන් සහ 2005.10.01 වැනි දින ලංකාදීප යන පුවත්පත් බලන්න.

*ඉඩමට පිවිසීම.–* මහනුවර නගර මධ්‍යයේ සිට කිලෝමීටර් 5ක් පමණ පැනිදෙනිය හන්දිය දක්වා ගමන්ගෙන දකුණට හැරී දවුලගල පාරේ කිලෝ මීටර් 1.2ක් පමණ එළුගොඩ මංසන්දිය දක්වා ගමන්කර නැවත දකුණට හැරී බෝයගම පාරට පිවිස මීටර් 100ක් පමණ ගමන්කල විට (3/8 බෝක්කුව දක්වා) මෙම දේපළට පිවිසිය හැක.

*ගෙවීමේ ක්‍රමය.–* විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුවේ.

ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), ප්‍රාදේශීය සභා බදු සඳහා 01% (සියයට එකයි), වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්), නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000. ලිපිකරු හා සෝෂක වේතනය රු. 500, සියලුම ප්‍රචාරක වියදම් ද, ගැණුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූවක්) විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් ප්‍රධාන කාර්යාලයට හෝ මහනුවර ශාඛාව වෙත ගෙවා නිමකළ යුතුවේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න, කළමණාකරු, කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්, මහනුවර ශාඛාව, අංක 120, කොටුගොඩැල්ල වීදිය, මහනුවර.

දුරකථන අංක : 081-2223163, 081-2223217, 081-2234392-3, 081-2222504 සහ 081-2225749, ෆැක්ස් අංකය : 081-2222440.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු,

අංක 432/1, මවුන්ට් ප්ලසන්ට් ගාර්ඩින්ස්,
හීරැස්සගල, මහනුවර.
දුරකථන අංක : 081-2217768, 071-4755974, 071-2755974, 071-4213497
ෆැක්ස් අංකය : 081-2217768.
12-40/2

---

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් -කෑගල්ල ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රධානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පදිංචියට සුදුසු ඉතා වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

රඹුක්කන ප්‍රාදේශීය සභා සීමාවන් තුළ මාරුක්වතුර ගමේ පොල්ගහවෙල, රඹුක්කන ප්‍රධාන මාර්ගයට මායිම්ව පිහිටි "මාරුක්වතුර වත්ත" නමැති ඉඩමෙන් බෙදා වෙන්කළ ඒකාබද්ධ ඉඩම් කැබලි හතරක් හා එහි තුළ පිහිටි ගොඩනැගිලි වගාව ඇතුළු අනෙකුත් සියලු දේ ඉඩමේ ප්‍රමාණය - අක්කර 02, රූඩ් 03, පර්. 04යි.

මෙම දේපළ දුක්ගන්නා වලව්වේ ආරියසේන යන අය බන්ධනදායී ලෙසට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

2005ක් වූ දෙසැම්බර් මස 28 වැනි දින පෙ. ව. 10.30ට එම දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2004.12.10 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද 2004.11.30 වැනි දින දිනමිණ, තිනකරන් සහ ඩේලිනිවුස් යන පුවත්පත් බලන්න.

*ඉඩමට පිවිසීම.–*කෑගල්ල සිට පොල්ගහවෙල මාර්ගයේ සැතපුම් 5 1/2ක් පමණ ඉඹුල්ගස්දෙනිය හන්දිය දක්වා ගමන්ගෙන එතැන් සිට දකුණු දෙසින් පිහිටි රඹුක්කන මහා මාර්ගයට පිවිස සැතපුම් 01ක් පමණ ගමන්කල විට මෙම දේපළට ලගාවිය හැකි.

*ගෙවීමේ ක්‍රමය.–* විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුවේ.

ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), ප්‍රාදේශීය සභා බදු සඳහා 01% (සියයට එකයි), වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්), නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000. ලිපිකරු හා සෝෂක වේතනය රු. 500, සියලුම ප්‍රචාරක වියදම් ද, ගැණුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූවක්) විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් ප්‍රධාන කාර්යාලයට හෝ කෑගල්ල ශාඛාව වෙත ගෙවා නිමකළ යුතුවේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න, කළමණාකරු, කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්, කෑගල්ල ශාඛාව, අංක 186, කෙලින් වීදිය, කෑගල්ල.

දුරකථන අංක : 035-2230232, 035-5240003, 035-2222034 ෆැක්ස් අංක : 035-2230231

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු,

අංක 432/1, මවුන්ට් ප්ලසන්ට් ගාර්ඩින්ස්,
හීරැස්සගල, මහනුවර.
දුරකථන අංක : 081-2217768, 071-4755974, 071-2755974, 071-4213497
ෆැක්ස් : 081-2217768.
12-40/1

---

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

එන්(පීවීඑස්) 6729.

**1982 අංක 17 දරන සමාගම් පනත**

**373(3) වැනි වගන්තිය යටතේ සීමාසහිත රන්ඩිෂා (ප්‍රයිවෙට්) ලිමිටඩ් නම කපා හැරීමේ දැන්වීම**

සමාගම් පනතේ විධිවිධාන යටතේ 1990.08.28 වැනි දින සංස්ථාපිත සමාගමක් වන රන්ඩිෂා (ප්‍රයිවෙට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව *නැතහොත්* ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, රන්ඩිෂා (ප්‍රයිවෙට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර්, ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම සමාගම් පනතේ 373(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර්.

2005 නොවැම්බර් මස 07 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.
12-17

---

එන්(පීවීඑස්) 22352.

**1982 අංක 17 දරන සමාගම් පනත**

**373(3) වැනි වගන්තිය යටතේ සීමාසහිත ටෙක්-විව් (ප්‍රයිවෙට්) ලිමිටඩ් නම කපා හැරීමේ දැන්වීම**

සමාගම් පනතේ විධිවිධාන යටතේ 1998.10.23 වැනි දින සංස්ථාපිත සමාගමක් වන ටෙක්-විව් (ප්‍රයිවෙට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව *නැතහොත්* ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, ටෙක්-විව් (ප්‍රයිවෙට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර්, ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම සමාගම් පනතේ 373(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර්.

2005 නොවැම්බර් මස 07 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.
12-16

එන්(පීවීඑස්) 25608.

**1982 අංක 17 දරන සමාගම් පනත**

373(3) වැනි වගන්තිය යටතේ විසිත ගෲප් (ප්‍රයිවෙට්) ලිමිටඩ් නම කපා හැරීමේ දැන්වීම

සමාගම් පනතේ විධිවිධාන යටතේ 2000.02.24 වැනි දින සංස්ථාපිත සමාගමක් වන විසිත ගෲප් (ප්‍රයිවෙට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව *නැතහොත්* ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, විසිත ගෲප් (ප්‍රයිවෙට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර්, ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම සමාගම් පනතේ 373(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර්.

2005 නොවැම්බර් මස 07 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.
12-15

---

එන්(පීවීඑස්) 13747.

**1982 අංක 17 දරන සමාගම් පනත**

373(3) වැනි වගන්තිය යටතේ සෙන්ට්‍රල් ෆොටෝ කම්පැණි (ප්‍රයිවෙට්) ලිමිටඩ් නම කපා හැරීමේ දැන්වීම

සමාගම් පනතේ විධිවිධාන යටතේ 1994.09.30 වැනි දින සංස්ථාපිත සමාගමක් වන සෙන්ට්‍රල් ෆොටෝ කම්පැණි (ප්‍රයිවෙට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව *නැතහොත්* ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, සෙන්ට්‍රල් ෆොටෝ කම්පැණි (ප්‍රයිවෙට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර්, ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම සමාගම් පනතේ 373(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර්.

2005 නොවැම්බර් මස 07 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.
12-14

---

එන්(පීවීඑස්) 21484.

**1982 අංක 17 දරන සමාගම් පනත**

373(3) වැනි වගන්තිය යටතේ කේස් එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ් නම කපා හැරීමේ දැන්වීම

සමාගම් පනතේ විධිවිධාන යටතේ 1998.06.23 වැනි දින සංස්ථාපිත සමාගමක් වන කේස් එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව *නැතහොත්* ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, කේස් එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර්, ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම සමාගම් පනතේ 373(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර්.

2005 නොවැම්බර් මස 07 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.
12-13

---

එන්(පීවීඑස්) 28224.

**1982 අංක 17 දරන සමාගම් පනත**

373(3) වැනි වගන්තිය යටතේ අමානාස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් නම කපා හැරීමේ දැන්වීම

සමාගම් පනතේ විධිවිධාන යටතේ 2001.04.04 වැනි දින සංස්ථාපිත සමාගමක් වන අමානාස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව *නැතහොත්* ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, අමානාස් ලංකා (ප්‍රයිවෙට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සම්ගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර්, ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම සමාගම් පනතේ 373(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර්.

2005 නොවැම්බර් මස 03 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.
12-18

---

**මහජන බැංකුව-පුත්තලම ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අංක 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2002.08.30 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

දංකොටුව ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ඒ. එෆ්. රන්දෙනිය මහතා විසින් සහතික කරන ලද 2000.07.28 දිනැති අංක 8940 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් බසීර් අහමඩ් ජසාර් යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ රුපියල් පන්ලක්ෂ පනස් පන්දහස් එකසිය හැට පහ (රු. 5,55,165)ක මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, රුපියල් පන්ලක්ෂ පනස් පන් දහස් එකසිය හැට පහ (රු. 5,55,165)ක මුදල සඳහා 2001.04.01 දින සිට වර්ෂයකට සියයට විසිතුන (23%) බැගින් වෙන්දේසි දිනය දක්වා තවදුරටත් පොළිය, පිරිවැටුම් බදු, ආරක්ෂක බදු, හා වෙන්දේසි ගාස්තු සමඟ අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් පන්ලක්ෂ පනස් පන් දහස් එකසිය හැට පහ (රු. 5,55,165)ක මුදලක් අයකර ගැනීම සඳහා මීගමුව බලයලත් වෙන්දේසිකාර ඩබ්ලිව්. පී. සී. පෙරේරා මහතා විසින් එකී අංක 8940 දරන උකස්කරයන් යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අංක 29ඩී වගන්තිය යටතේ පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

**දේපළ පිළිබඳ විස්තරය**

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, පුත්තලම ඉඩම් ලියාපදිංචි කිරීමේ කොටසට අයත් අළුත්කුරු කෝරළයේ, පුත්තලම කඩවත් කෝරළයේ, පුත්තලම කඩවත් පත්තුවේ, පුත්තලම නගරයේ අනුරාධපුර පාර පිහිටි පිට්ටනිය *හෙවත්* පිට්ටනිය *හෙවත්* පිට්ටනි නමැති ඉඩමට එන්. පොන්නදුරෙයි බලයලත් මිනින්දෝරු තැන විසින් 1981.03.30 දින මැන සකස් කරන ලද අංක 2133 දරන පිඹුරේ දැක්වෙන පර්චස් එකොළහයි දශම අටක් (අ. 0, රූ. 0, පර්. 11.8) විශාල ඉඩම පොන් තංගවඩිවේලු බලයලත් මිනින්දෝරු තැන 2000.05.10 දින මැන සාදන ලද අංක 1026 දරන පරිදි බෙදී වෙන්වුන ලොට් අංක 01 දරන කොටසට මායිම්, උතුරට : රාජදුරෙයිගේ ඉඩම ද, නැගෙනහිරට : අනුරාධපුර පාර සිට නිවෙස දක්වා විහිදෙන පාර, දකුණට : රාසික් සතු ඉඩම ද, බස්නාහිරට : හින්දු මහ සභාව සතු දේපළ ද යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් එකොළහයි දශම අටක් (අ. 0, රූ. 0, පර්. 11.8) විශාල ඉඩමේ බිම සහ එහි පිහිටි වැවිලි, ගොඩනැගිලි ආදී සියලු දේත් වේ.

මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ E. 111/108 යටතේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
ප්‍රාදේශීය කළමනාකාර,
හලාවත.

මහජන බැංකුව,
ප්‍රාදේශී ප්‍රධාන කාර්යාලය,
අංක 79, මාරවිල පාර,
නාත්තන්ඩිය.
12-44

---

**මහජන බැංකුව-කටුනායක ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2005.07.27 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. පී. එල්. විජේසිරිවර්ධන විසින් සහතික කරන ලද 2003.04.03 දිනැති අංක 7938 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, මල්ලව තන්ත්‍රිගේ අනුර රංජිත් පෙරේරා සහ පාවුළුගේ සමන්ත ගාමිණී ප්‍රනාන්දු යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් එක්ලක්ෂ අනූඑක්දහස් පනස් හතරයි ශත තිස්හත (රු. 1,91,054.37)ක මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2004.09.16 දින සිට වර්ෂයකට 21.5% බැගින් රුපියල් එක්ලක්ෂ අනූඑක් දහස් පනස් හතරයි ශත තිස්හත (රු. 1,91,054.37)ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාල මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමඟ අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් එක්ලක්ෂ අනූඑක්දහස් පනස් හතරයි ශත තිස්හත (රු. 1,91,054.37)ක මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. එස්. රාමනායක විසින් එකී අංක 7938 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

**දේපළ පිළිබඳ විස්තරය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, දාසිය පත්තුවේ, මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභා උප කාර්යාල සීමාවේ යටියන පිහිටි කෝපිවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. ඒ. යූ. සෙනරත් විසින් (1998.01.14 දින මැන) 1998.06.20 වැනි දින බෙදා වෙන් කරන ලද අංක 148 දරන පිඹුරේ ලොට් අංක 3 දරන කොටසට මායිම්, උතුරට : ලොට් 2 ද, නැගෙනහිරට : ප්‍රාදේශීය සභා පාර, දකුණට : ලොට් 4 ද, බස්නාහිරට : ලොට් 4, 1 හා 2 ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහනමයයි දශම දෙක (අ. 0, රූ. 0, පර්. 19.2) ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැවිලි, ගොඩනැගිලි ආදී සියළු දේත් වේ.

මෙම ඉඩම මීගමුව ඉඩම් ලියාපදිංචි කිරිමේ කාර්යාලයේ සී869/78හි ලියාපදිංචි කර ඇත.

ඉහත පිඹුරේ පාරවල් සඳහා වෙන්කර ඇති කොටස්වල මාර්ග අයිතිය ද සමඟ වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
ප්‍රාදේශීය කළමනාකාර,
ගම්පහ.

මහජන බැංකුව,
බටහිර III කලාප කාර්යාලය,
අංක 131, නුවර පාර,
බැලුම්මහර,
මුදුන්ගොඩ.
12-41

---

**මහජන බැංකුව - පුත්තලම ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අංක 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අංක 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2004.06.01 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මාරවිල ප්‍රසිද්ධ නොතාරිස්, රුවිනි ඒ. එස්. දසනායක මහත්මිය විසින් සහතික කරන ලද 2001.11.12 දිනැති අංක 12 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, වර්ණකුලසූරිය ඇග්නස් ප්‍රනාන්දු සහ ලොකු ගලප්පත්තිගේ නිමල් ශාන්ත යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ රුපියල් හාරලක්ෂ විසිතුන් දහස් හත්සිය එකොලහයි ශත හැට දෙක (රු. 423,711.62)ක මුදල සඳහා 2002.09.04 දින සිට වර්ෂයකට සියයට විසි හතර (24%) බැගින් වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය, පිරිවැටුම් බදු, ආරක්ෂක බදු හා වෙන්දේසි ගාස්තු ද සමඟ අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් හාරලක්ෂ විසිතුන් දහස් හත්සිය එකොළහයි ශත හැට දෙක (රු. 423,711.62)ක මුදල අයකර ගැනීම සඳහා මීගමුව බලයලත් වෙන්දේසිකාර ඩබ්. පී. සී. පෙරේරා මහතා විසින් එකී අංක 12 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අංක 29ඩී වගන්තිය යටතේ පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

**උකස් කර ඇති දේපළ පිළිබඳ විස්තරය**

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, කල්පිටිය ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාසයට අයත්, මාම්පුරිය ග්‍රාම සේවා නිලධාරී කොට්ඨාසයේ, මාම්පුරිය නමැති ගමේ පිහිටි මාම්පුරිය නමැති රජයේ ඉඩමට සර්වේ ජනරාල්වරයා විසින් සාදනු ලැබූ ඔහු භාරයේ ඇති අංක අ. ග. පි. 3283 දරන පිඹුරෙහි අංක 308 දරන හෙක්ටයාර් බිංදුවයි දශම පහයි දෙකයි බිංදුවක් (හෙක්. 0.520) විශාල ඉඩම, නැවත වර්ෂ 2001ක් වූ අගෝස්තු මස 10 වැනි දින වී. අයි. බාලසුබ්‍රමනියම් බලයලත් මිනින්දෝරු මහතා විසින් මැන සෑදූ අංක 1914 දරන සිතියමේ සඳහන් ප්‍රකාර ලොට් අංක 01 දරන කොටසට මායිම්, උතුරට අංක එෆ්. වී. පී. 3283 දරන පිඹුරේ කැබලි අංක 307 සහ පාරක් සඳහා වෙන් කර ඇති කැබලි අංක 279 ද, නැගෙනහිරට : අංක එෆ්. වී. පී. 3283 දරන පිඹුරේ කැබලි අංක 307 සහ 324 ද, දකුණට : අංක එෆ්. වී. පී. 3283 දරන පිඹුරේ කැබලි අංක 309 සහ 323 1/2 සහ 324 දරන කොටස් ද, බස්නාහිරට : අංක එෆ්. වී. පී. 3283 දරන පිඹුරේ කැබලි අංක 309 සහ 279 දරන කොටස් ද යන මෙකී මායිම් තුළ පිහිටි අක්කර එකයි, රූඩ් එකයි, පර්චස් පහයි දශම හයක් (අ. 1, රූ. 1, පර්. 5.6) ක් විශාල ඉඩමේ බිම සහ ඊට අයත් ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සෑම සියළු දේත් වේ.

ඉහත අංක 1914 දරන පිඹුරේ කැබලි අංක 279 දරන පාරක් සඳහා වෙන් කර ඇති බිම් තීරය පොදුවේ පාරක් වශයෙන් පාවිච්චි කිරීමේ මාර්ග පරවශ්‍යතා අයිතියද මේ සමඟ වේ.

මෙය පුත්තලම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල්ඩීඕ 31/296 යටතේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
ප්‍රාදේශීය කළමනාකරු,
හලාවත.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 79, මාරවිල පාර,
නාත්තන්ඩිය.
12-42

---

**ලංකා බැංකුව**

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරිය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2005.04.25 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. මහජන නොතාරිස් ජී. සී. පී. තිලකරත්න විසින් සහතික කරන ලද 2003.04.28 දිනැති අංක 2041 දරන බැඳුම්කරය මත මුල් මුදල හා 2005.02.10 දින තෙක් පොළිය වශයෙන් අයිරා ගිණුම මත රුපියල් දසලක්ෂ තිස්දෙදහස් අනූතුනයි ශත තිස්දෙකක (රු. 10,32,093.32) මුදලක් සමග අනුමත සීමාව රුපියල් අටලක්ෂ හැත්තෑපන්දහසක් (රු. 8,75,000) මත වසරකට සියයට දාහතරයි දශම පහ (14.5%) බැගින්ද අනුමත සීමාව ඉක්මවන ශේෂය මුදලක් මත වසරකට සියයට විසිහය (26%) බැගින්ද, පොළියක් ගෙවීම නිම කරන දිනය තෙක් දූනගහ, මීගමුව පාර, දූනගහ, අංක 23 හි පදිංචි ශ්‍රේෂන් ධර්මසේන රාජපක්ෂ මහතාගෙන් අයවිය යුතුව ඇත.

2. 2003.04.28 දිනැති අංක 2041 දරන බැඳුම්කරය මත අයවිය යුතු එකී රුපියල් දශලක්ෂ තිස්දෙදහස් අනූතුනයි ශත තිස්දෙකක (රු. 10,32,093.32) මුදල සමග 2005.02.11 දින සිට විකිණීමේ දිනය තෙක් ඉහතකී ආකාරයට අයවිය යුතු පොළියද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගතහැකි ගාස්තු සහ මුදල්ද, අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස්කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට ගම්පහ, උසාවිය පාර, සණස චතුරශ්‍රය, අංක 15 හි පදිංචි වෙන්දේසිකාර ටී. එම්. එස්. පීරිස් මහතාට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරිය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ මෙයින් අවසරදී බලය පවරනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළයේ, රාගම්පත්තුවේ, ජා-ඇල ප්‍රාදේශීය සභා සීමාවේ බටගම දකුණ ග්‍රාමයේ වරිපනම් අංක 124 දරන බාලසූරිය මාවතේ පිහිටියාවූද, මිල්ලගහවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඩබ්. ජේ. ද සිල්වා විසින් සාදන ලද 1994.09.08 දිනැති අංක 4938 දරන මිණුම් පිඹුරේ විස්තර කළ 1999.08.17 දිනැති උප බෙදුමේ පිටසන අනුව ලොට් 2ඒ වශයෙන් සඳහන් බෙදනලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට : බාලසූරිය මාවතද, නැගෙනහිරට : ලොට් 2බී ද, දකුණට : ලොට් 2බී ද, බස්නාහිරට : ලොට් 1 ද මායිම්ව එකී අංක 4938 දරන පිඹුර අනුව පර්චස් දොළහක (අ. 0, රූ. 0, පර්. 12) බිම් ප්‍රමාණය සමග එහි පිහිටි සියලු දේ වේ.

ඉහතකී බටගම ග්‍රාමයේ වරිපනම් අංක 124 දරන බාලසූරිය මාවතේ පිහිටියාවූද, මිල්ලගහවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඩබ්. ජේ. ද සිල්වා විසින් සාදන ලද 1994.09.08 දිනැති අංක 4938 දරන මිණුම් පිඹුරේ විස්තර කළ 1999.08.17 දිනැති උප බෙදුම් පිටසනට අනුව ලොට් 2බී වශයෙන් සඳහන් බෙදනලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට : බාලසූරිය මාවතද, නැගෙනහිරට : ලොට් 3 ද, දකුණට : ද මෙසනාඩ් විදුහලේ පරිශ්‍රයද, බස්නාහිරට : ලොට් 1 සහ 2ඒ ද මායිම්ව එකී අංක 4938 දරන පිඹුර අනුව පර්චස් විස්ස (අ. 0, රූ. 0, පර්. 20) බිම් ප්‍රමාණය සමග එහි පිහිටි සියලු දේ වේ.

එකී ලොට් 2ඒ සහ 2බී පහත සඳහන් ඉඩමේ උප බෙදුම් වේ.

එකී බටගම දකුණ ග්‍රාමයේ වරිපනම් අංක 124 දරන බාලසූරිය මාවතේ පිහිටියාවූද, මිල්ලගහවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඩබ්. ජේ. ද සිල්වා විසින් සාදන ලද 1994.09.08 දිනැති අංක 4938 දරන මිණුම් පිඹුරේ විස්තර කළ ලොට් 2 වශයෙන් සඳහන් බෙදනලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට : බාලසූරිය මාවතද, නැගෙනහිරට : ලොට් 3 ද, දකුණට : ද මෙසනාඩ් විදුහලේ පරිශ්‍රයද, බස්නාහිරට : ලොට් 1 ද මායිම්ව එකී අංක 4938 දරන පිඹුර අනුව පර්චස් තිස්දෙකක (අ. 0, රූ. 0, පර්. 32) බිම් ප්‍රමාණය සමග එහි පිහිටි සියල් දේ වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී417/182 හි ලියාපදිංචි කර ඇත.

කේ. ඩී. එස්. කරුණාරත්න,
ශාඛා කළමනාකරු.

ලංකා බැංකුව,
දිවුලපිටිය.
12-62

# ආණ්ඩුවේ දැන්වීම්

## 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය යටතේ දැන්වීම

එන් 247

මගේ අංකය :සො/ඉ/1/5/86

මෙහි පහත සඳහන් උපලේඛනයේ විස්තර කරන ඉඩම් රජයට ලබාගැනීමට බලාපොරොත්තුවේ. වැඩි විස්තර සඳහා වර්ෂ 2005 ක්වූ අප්‍රේල් මස 08 වැනි දින අංක 1387/21 දරන ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ (III )* කොටස බලන්න.

විල්බට් තෙන්නකෝන්,
ප්‍රාදේශීය ලේකම්,
සොරණාතොට.

2005 අගෝස්තු මස 04 වැනි දින,
සොරණාතොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී ය,

### උපලේඛනය

| | | |
|---|---|---|
| *ප්‍රා. ආ. නි. කොට්ඨාසය* | : | සොරණාතොට |
| *දිස්ත්‍රික්කය* | : | බදුල්ල |
| *ගම* | : | උඩඇලේගම |
| *මූලික සැලැස්මේ අංකය* | : | අ. ග. පි. 88 |
| *කැබලි අංක* | : | 336, 339, 340, 341, 342, 344, 345, 346, 347, හා 348. |

---

## ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තිය යටතේ දැන්වීම

එන් 248

මගේ අංකය :එම්පීඅයි/9/1/6/8සී-13

ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ රජයට අත්කර ගෙන ඇති පහත සඳහන් ඉඩම සඳහා එම පනතේ 9 වන වගන්තිය යටතේ හිමිකම් හා වන්දි පරීක්ෂණය 2005.10.27 වැනි දින වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ, වැවිලි කළමණාකරණ අධීක්ෂණ අංශයේදී මා විසින් පවත්වනු ලබන බැව් මහජනයාගේ දැන ගැනීම සඳහා මෙයින් දන්වා සිටිනු ලැබේ. මෙම ඉඩම කෙරෙහි සම්බන්ධතාවයක් ඇති අය විසින් එම පරීක්ෂණය සඳහා ඉදිරිපත් විය යුතුය. වැඩි විස්තර සඳහා 2005.09.08 වැනි දිනැති අංක 1409/15 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රය* බලන්න.

ජේ. එම්. සී. ප්‍රියදර්ශනී,
අත්කර ගැනීමේ නිලධාරි,
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

2005 සැප්තැම්බර් 08 වැනි දින,
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේදී ය.

### උපලේඛනය

| | | |
|---|---|---|
| *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | : | ඉඹුල්පේ |
| මූලික පිඹුරු අංකය | : | අ. භූ. පි. 06 |
| *කැබලි අංක* | : | 360 |
| *මුළු ඉඩමේ ප්‍රමාණය* | : | 10.1170 හෙක්. |
| *ඉඩම පිහිටි ගම* | : | කණතිරියන්වල. |

---

## 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කරගැනීමේ පනතේ (460 වන පරිච්ඡේදය) 7 වෙනි වගන්තිය යටතේ දැන්වීම

එන් 249

යොමු අංකය : 4/3/1/70

මෙහි පහත සඳහන් උපලේඛනයේ විස්තර කරන ඉඩම් රජයට අත්පත් කර ගැනීමට බලාපොරොත්තු වේ. වැඩි විස්තර සඳහා අංක 1410/27 දරන 2005.09.14 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රය* බලන්න.

බී. ජී. එස්. ගුණතිලක,
ප්‍රාදේශීය ලේකම්,
කළුතර

2005 සැප්තැම්බර් මස 14 වැනි දින,
කළුතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
කළුතර.

### උපලේඛනය

| | | |
|---|---|---|
| *දිස්ත්‍රික්කය* | : | කළුතර |
| *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | : | කළුතර |
| *ග්‍රාම සේවා කොට්ඨාසය* | : | 727ඒ- ඇටවිල |
| ගමේ නම | : | මහ හීනටියන්ගල |
| ඉඩමේ නම | : | ඇටවිලවත්ත |
| සැලසුම් අංකය | : | මුපික. 3767 |
| කැබලි අංක | : | අංක 1 |
| ප්‍රමාණය | : | හෙක්. 0.962 |

---

## 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වන පරිච්ඡේදය) 7 වන වගන්තිය යටතේ දැන්වීම

එන් 250

යොමු අංකය : **3/3/3/5**

මෙහි පහත සඳහන් උපලේඛනයේ විස්තර කරන ඉඩම රජයට අත්පත් කර ගැනීමට බලාපොරොත්තු වේ. වැඩි විස්තර සඳහා 2005.08.22 වැනි දින අංක 1407/02 දරන ශ්‍රී ලංකා ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* (III) වැනි කොටස බලන්න.

බී. එම්. එස්. දමයන්ති පෙරේරා
ප්‍රාදේශීය ලේකම් හා
රත්තොට

2005 අගෝස්තු 16 වැනි දින
රත්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී ය.

### උපලේඛනය

| | | |
|---|---|---|
| *දිස්ත්‍රික්කය* | : | මාතලේ |
| *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | : | රත්තොට |
| *ගම* | : | රත්තොට, ගල්ගේවත්ත, ඉහළ |
| *පිහිටීම* | : | මාතලේ දිස්ත්‍රික්කයේ රත්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උඩසිය පත්තුවේ ගල්ගේවත්ත ඉහළ ගම |
| *ඉඩමේ නම* | : | ගල්ගේවත්ත |
| මූලික සැළැස්මේ සහ කැබැල්ලේ අංකය | : | මැණුම් අධිකාරිගේ අංක 1348 දරන පිඹුරේ කැබලි අංක 01. |

---

## 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වන පරිච්ඡේදය) 7 වෙනි වගන්තිය යටතේ දැන්වීම

එන් 251

යොමු අංකය :මාස්/ඉ/1/129/1
එල්/03/ජේ/95/එච්ඩබ්/16

පහත සඳහන් උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම ආණ්ඩුවට ගැනීමට අදහස් කර තිබේ වැඩි විස්තර සඳහා 2005.10.18 වැනි දින අංක 1415/09 දරන ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ III* වන කොටස බලන්න.

කේ. ඩී. බී. ජයසිංහ,
සහකාර ප්‍රාදේශීය මහ ලේකම්,
මාස්පොත.

2005 ඔක්තෝබර් මස 07 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
මාස්පොත.

### උපලේඛනය

| | | |
|---|---|---|
| *ගමේ නම සහ විස්තරය* | : | වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මාස්පොත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කුඩාගල්බොඩ කෝරළේ මාස්පොත නැමැති ගම සහ වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වාරියපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වල්ගම්පත්තු කෝරළේ හංහමුණුව නැමැති ගම. |

මුද්‍රණය හා බෙදාහැරීම සීමාසහිත ශ්‍රී ලංකා එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසිනි.
www.documents.gov.lk

# ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය

තොරතුරු හා මාධ්‍ය අමාත්‍යාංශය

(1984 අංක 18 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කරන ලද්දකි)

## ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය මෙහෙයවන 2006 වර්ෂය සඳහා ඔෆ්සෙට් මුද්‍රණ ශිල්පය පිළිබඳ පාඨමාලා

ශ්‍රී ලංකාවේ මුද්‍රණ ක්ෂේත්‍රයට අදාල පාඨමාලා හඳුන්වාදීමේ අද්විතීය ස්ථානයක් ලබා සිටින තොරතුරු හා මාධ්‍ය අමාත්‍යාංශය යටතේ පැවැත්වෙන ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය මගින් 2006 වර්ෂය සඳහා ඕෆ්සෙට් මුද්‍රණ කේෂ්ත්‍රයට (Offset Printing) අදාල පහත සඳහන් පාඨමාලා හඳුන්වා දෙයි.

2006 ජනවාරි මාසයේදී ආරම්භ කිරීමට නියමිත මෙම පාඨමාලාවලට අයදුම්පත් කැඳවීම දැන් ආරම්භ කර ඇත. මෙම පාඨමාලා වලට ඇතුල් කිරීම සීමා කෙරෙන අතර තෝරා ගැනීම සම්මුඛ පරීක්ෂණයකින් අනතුරුව සිදු කෙරේ.

01. ඕෆ්සෙට් පත් ලිතෝ යන්ත්‍ර ක්‍රියාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව :
(Certificate Course in Sheet Fed Litho Press Operations)

මෙම පාඨමාලාව තුලින් පත් ලිතෝ යන්ත්‍ර ක්‍රියාකරණය පිළිබඳ (Sheet Fed Press Operations) පුළුල් අවබෝධයක් හා මනා ප්‍රායෝගික පුහුණුවක් ලබා දේ.

මාස 08 ක පමණ කාලයක් පුරා සිංහල මාධ්‍යයෙන් පැවැත්වෙන මෙම අර්ධ කාලීන පාඨමාලාව න්‍යායාත්මක හා ප්‍රායෝගික පංති වලින් සමන්විත වේ.

මෙම පාඨමාලාව ක්ෂේත්‍රයේ නියැලි පුද්ගලයින්ට මෙන්ම මුද්‍රණ ක්ෂේත්‍රයට ඇතුලත් වීමේ උනන්දුවක් දක්වන නවකයන්ට ද සුදුසු වන අයුරින් පාඨමාලා අන්තර්ගතය සම්පාදනය කොට ඇත.

*පාඨමාලා අන්තර්ගතය* :

* Basic Principles of Offset Lithography
* Introduction to Pre-press
* Plates and Blankets
* Damping and Inking Systems
* Paper and Ink requirements
* Cylinder Paking and Pressure Control
* Press register system and control
* Press Tubleshooting
* Improvement of quality in sheet fed Colour Printing
* New Technological Developments in the Printing Industry

02. ඕෆ්සෙට් ලිතෝකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව :
(Certificate Course in Offset Lithography)

මෙම පාඨමාලාව තුළින් ඔෆ්සෙට් ලිතෝකරණය පිළිබඳ පුළුල් දැනුමක් සහ අවබෝධයක් ලබාදෙන අතර මුද්‍රණ ආයතනයක ඵලදායීතාව හා තත්ත්වයෙන් උසස් නිෂ්පාදන ලබාගන්නා අයුරු මැනවින් පැහැදිලි කෙරේ.

සිංහල සහ ඉංග්‍රීසි භාෂා මාධ්‍ය වලින් පැවැත්වෙන මෙම අර්ධ කාලීන පාඨමාලාව වසරකට ආසන්න කාලයක් පැවැත්වෙන අතර ප්‍රායෝගික හා න්‍යායාත්මක පංති වලින් සමන්විතව පැවැත්වේ.

*පාඨමාලා අන්තර්ගතය* :

* Principles of Offset Lithography
* Understanding, Conventional and Digital pre-pres operations
* Colour Theory
* Super - Imposition
* Layout Operations
* Film Assembly
* Offset Plate Making
* Offset Press Operations
* Paper and ink Technology
* Offeset press Configuration
* New Technological Development in the Printing Industry

මේ පිළිබඳ උනන්දුවක් දක්වන අයදුම්කරුවන් කොළඹ, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ පිහිටි ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය, නො.118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, බොරැල්ල යන ලිපිනයෙන් හෝ දුරකථන අංක 2686162, 2679791 අමතා කථා කිරීමෙන් ද විස්තර ලබා ගත හැක.